සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

21 S I

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

Third Term Test - Grade 13 - 2018

විභාග අංකය .... ආර්ථික විද්‍යාව I කාලය පැය දෙකයි

❖ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සපයන්න.
❖ වඩාත් නිවැරදි පිළිතුර තෝරා පිළිතුරට හිමි අංකය මෙම පත්‍රයේම තිත් ඉරිමත ලියන්න.

01. පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් සූක්ෂම ආර්ථික න්‍යායට අදාළවන ප්‍රකාශය කුමක්ද?
1. ආන්තික නිමැවුම අඩුවීම ආන්තික පිරිවැය ඉහළ යාමට හේතුවේ.
2. මුදල් සැපයුම ඉහළ යාම පොලී අනුපාතිකය ඉහළ යාමට හේතුවේ.
3. පොලී අනුපාතිකය පහළ යාම මුදල් ඉල්ලුම ඉහළ යාමට හේතුවේ.
4. සමස්ත නිෂ්පාදිතය පහළ යාම සේවා නියුක්තිය පහළ යාමට හේතුවේ.
5. යෙදවුම් මිල ඉහළයාම මිල මට්ටම ඉහළ යාමට හේතුවේ. (...........)

02. පහත සඳහන් ඒවා අතුරින් යථානුරූපී ප්‍රකාශය හඳුනාගන්න.
1. සමහර ස්වභාවික සම්පත් භාවිතයත් සමග ක්ෂය වී යා හැකිය.
2. දිළින්දන්ට දෙනු ලබන ප්‍රතිලාභ ඉහළ දැමීමෙන් දරිද්‍රතාව තුරන් කළ හැකිය.
3. ආදායම් ව්‍යාප්ති විෂමතාව අවම කිරීමට ආර්ථික වෘද්ධිය ඉහළ නැංවිය යුතුය.
4. ආර්ථිකයක වෘද්ධියේ ප්‍රතිලාභ සියලු පුරවැසියන් වෙත සමානව බෙදී යා යුතුය.
5. ලංකාවේ වියපත් ජන සංඛ්‍යාව ඉහළ යාමට පිළියම් ලෙස විශ්‍රාම වයස ඉහළ දැමීම යෝග්‍ය වේ. (...........)

03. එක්තරා ආර්ථිකයක සම්පත් භාවිත කරන විවිධ ආකාර පහත රූපයේ දැක්වේ.



ඉහත රූප සටහනට අනුව ආර්ථික පසුබැසීමකදී නිමැවුම් සංයෝගය,

1. A සිට B දක්වා විතැන්වේ.
2. B සිට D දක්වා විතැන්වේ.
3. E සිට D දක්වා විතැන්වේ.
4. D සිට C දක්වා විතැන්වේ.
5. A සිට C දක්වා විතැන්වේ. (...........)

04. පහත සඳහන් සිදුවීම් අතරින් නිෂ්පාදන හැකියා වක්‍රයක් දකුණට විතැන් වීම සඳහා බල නොපාන සාධකය වන්නේ,
1. ඉල්ලුම වැඩිවීම නිසා නිෂ්පාදනය ඉහළ යාම.
2. විදේශීය ශ්‍රමිකයන් පිරිසක් පැමිණීම නිසා නිෂ්පාදනය ඉහළයාම.
3. සාධක ඵලදායිතාවය ඉහළ යාමෙන් නිෂ්පාදනය ඉහළයාම.
4. යටිතල පහසුකම් ඉහළ යාමෙන් නිෂ්පාදනය ඉහළයාම.
5. තාක්ෂණික දියුණුවක් හේතුවෙන් නිෂ්පාදනය ඉහළයාම. (...........)

05. පෞද්ගලික ව්‍යවසායන් සහිත ආර්ථිකයක භාණ්ඩ වෙළෙඳපොල මගින් මිල සංඥාවන් ලබාදෙනු ඇත. ඒ අනුව විසඳා ගනු ඇතැයි සැලකෙන ප්‍රධාන ප්‍රශ්නය වන්නේ,
1. තිරසාර සංවර්ධනය අත්කර ගැනීමයි.
2. සාධාරණ ආදායම් ව්‍යාප්තියක් සමාජය තුළ ඇති කිරීමයි.
3. ආර්ථිකයේ පරිභෝජන රටාවන් හා නිෂ්පාදන රටාවන් පිළිබඳ තිරණ ගැනීමයි.
4. භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය යන සාධක සේවා නියුක්ත කිරීමේ ගැටළුව විසඳීමයි.
5. නිපදවනු ලබන්නේ කුමක්ද? යන්න පිළිබඳව ඇති ගැටළුව විසඳා ගැනීමයි. (...........)

06. ශ්‍රී ලංකා ආර්ථිකය 2000 වර්ෂයෙන් පසුව වේගවත් සමාජීය වෙළෙඳපොළ ආර්ථිකයක් බවට පත් කිරීමට අපේක්ෂිතය. එවැනි වෙළෙඳපොළ ආර්ථිකයක් විසින් අවධාරණය කරනුයේ,
1. සමාජ සාධාරණත්වය දැඩිව අවධාරණය කරමින් මානව හිමිකම් ආරක්ෂා කිරීමය.
2. වෙළෙඳපොළ ආර්ථිකයක පවතින අකාර්යක්ෂමතාව ඉවත් කිරීමට රජය මැදිහත්වීමයි.
3. පුද්ගල ජීවන තත්ත්වය උසස් කරමින් ආර්ථික වෘද්ධිය ඇති කිරීමයි.
4. ආර්ථිකයේ නීතිමය පදනම ස්ථාපිත කිරීමට රාජ්‍ය යාන්ත්‍රණය ශක්තිමත් කිරීමයි.
5. සමාජයේ සෑම පුරවැසියෙකුටම සාධාරණ ලෙස ආදායම් බෙදා හැරීමයි. (...........)

07. කිසියම් භාණ්ඩයක වෙළඳපොළ ඉල්ලුම් වක්‍රයේ විතැන් වීමකට හේතු නොවන සාධකය මින් කුමක්ද?
1. ගැනුම්කරුවන්ගේ සංඛ්‍යාව වැඩිවීම
2. භාණ්ඩයේ අපේක්ෂිත අනාගත මිල වැඩිවීම
3. එම භාණ්ඩයේ මිල වැඩිවීම
4. පාරිභෝගික ආදායම වැඩිවීම
5. අනුපූරක භාණ්ඩයේ මිල වැඩිවීම (...........)

08. වෙළෙඳපොලේ අලෙවි වන භාණ්ඩයක් සඳහා ඉල්ලුම් හා සැපයුම් ලේඛන වලට අදාළ දත්ත සමහරක් පහත දී ඇත.

භාණ්ඩයේ මිල (රු)	**ඉල්ලුම් ප්‍රමාණය (ඒකක)**	**සැපයුම් ප්‍රමාණය ඒකක**
6	20	20
8	10	30

මෙම භාණ්ඩයේ ඒකකයක් මත රු. 2 ක බද්දක් නිෂ්පාදකයාගෙන් ආණ්ඩුව අය කරයි නම්, බද්දෙන් පසු සැපයුම් සමීකරණය වන්නේ,
1. $Qs_t = 50 + 5P$
2. $Qs_t = -20 + 5P$
3. $Qs_t = -10 + 5P$
4. $Qs_t = 20 + 5P$
5. $Qs_t = 10 + 5P$ (...........)

09. පහත රූප සටහනේ A ලක්ෂ්‍යයෙන් පෙන්නුම් කෙරෙන්නේ X නැමති භාණ්ඩය සඳහා තීරණය වී ඇති වෙළෙඳපොළ සමතුලිතයයි.



මෙම භාණ්ඩයේ වෙළෙඳපොළ සමතුලිතය A ලක්ෂ්‍යයේ සිට B ලක්ෂ්‍යය වෙත මාරු වීමට බලපෑ සාධකය වන්නේ,
1. X භාණ්ඩයෙහි මිල ඉහළයාමය.
2. Y නැමැති අනුපූරක භාණ්ඩයේ මිල ඉහළ යාමය.
3. X භාණ්ඩයෙහි නිෂ්පාදන පිරිවැය වැඩිවීමයි.
4. X භාණ්ඩයෙහි සැපයුම වැඩිවීමයි.
5. Z නැමති ආදේශක භාණ්ඩයේ මිල ඉහළයාමය. (...........)

10. ඉල්ලුමේ මිල නම්‍යතාව ඒකීය වන සාමාන්‍ය භාණ්ඩයක,
1. මිල වැඩිවීමට සමානුපාතිකව ඉල්ලුම් ප්‍රමාණය වැඩිවේ.
2. මිල අඩුවන විට පාරිභෝගික පැහැදම වැඩිවේ.
3. ඉල්ලුම් කරන ප්‍රමානයේ කිසිඳු වෙනසක් සිදුනොවේ.
4. මිල වැඩිවන විට නිෂ්පාදක අයභාරය වැඩිවේ.
5. ඉල්ලුම් ලේඛනයක මිල සහ ප්‍රමාණය ගුණ කළ විට ලැබෙන පිළිතුර සෑම අවස්ථාවකදීම සමාන වේ.(..........)

11. අර්තාපල් සඳහා දේශීය වෙළෙඳපොලේ පවත්නා ඉල්ලුම් හා සැපයුම් වක්‍ර පහත රූප සටහන මගින් පෙන්නුම් කරයි.



අර්තාපල් 1 Kg ක් P_2 මිල යටතේ ලෝක වෙළෙඳපොළෙන් ආනයනය කරන තත්වයක් යටතේ එකඟ විය නොහැකි ප්‍රකාශය කුමක්ද?
1. දේශීය සැපයුම් ප්‍රමාණය Q_1 සිට Q_2 දක්වා අඩුවේ.
2. නිෂ්පාදක අතිරික්තය වැඩිවේ.
3. පාරිභෝගික අතිරික්තය වැඩිවේ.
4. Q_2 සිට Q_3 ප්‍රමාණයක් ආනයනය කරයි.
5. දේශීය ඉල්ලුම් ප්‍රමාණය Q_1 සිට Q_3 දක්වා වැඩිවේ.
(...........)

12. පාරිභෝගිකයන්ට අත්‍යාවශ්‍ය වන ගෘහස්ත ගෑස් සිලින්ඩරයක් සඳහා නම්‍ය සැපයුම් තත්ත්වයක් පවතින බව සලකන්න. මෙම භාණ්ඩය සඳහා නිෂ්පාදන සහනාධාරයක් ලබා දෙනු ලැබුවහොත් සහනාධාරයේ වාසිය,

1. විශාල වශයෙන් ගැනුම්කරුවන්ට හිමිවේ.
2. විශාල වශයෙන් විකුණුම්කරුවන්ට හිමිවේ.
3. මුළුමනින්ම පාරිභෝගිකයන්ට හිමිවේ.
4. මුළුමනින්ම නිෂ්පාදකයන්ට හිමිවේ.
5. ගැනුම්කරුට හා විකුණුම්කරුට සමානව හිමි වේ. (...........)

13. සීනි සඳහා වෙළෙඳපොල ඉල්ලුම් ශ්‍රිතය Qd = 500 – 6P ද සැපයුම් ශ්‍රිතය Qs = -200+4P ද වේ. මෙම තත්ත්වය යටතේ සීනි කිලෝ ඒකක මිල රු. 60 ක් ලෙස රජය විසින් නියම කරනු ලැබුවහොත් වෙළෙඳපොලෙහි,

1. සීනි කිලෝ 140 ක අධි ඉල්ලුමක් හටගනී.
2. සීනි කිලෝ ග්‍රෑම් 178 ක සැපයුමක් හටගනී.
3. සීනි කිලෝ ග්‍රෑම් 100 ක අධි සැපයුමක් හටගනී.
4. සීනි කිලෝ ග්‍රෑම් 100 ක අධි ඉල්ලුමක් හටගනී.
5. අධි සැපයුම නිසා සීනි මිල පහළ යයි. (...........)

14. කාර්මික භාණ්ඩයක් සඳහා ඇති වෙළෙඳපොළ පහත රූප සටහන නිරූපණය කරයි.



මෙම භාණ්ඩ ඒකකයක් මත විශේෂිත බද්දක් පනවනු ලැබුවහොත් බද්දට පසු අහිමි වන නිෂ්පාදක අතිරික්තය හා අහිමිවන පාරිභෝගික අතිරික්තය පෙන්නුම් කරනුයේ කවර ප්‍රදේශ වලින්ද?

	අහිමි වන පාරිභෝගික අතිරික්තය	**අහිමි වන නිෂ්පාදන අතිරික්තය**
1.	B + C + D	E + G + F
2.	A	H
3.	A+B+C+D	B+C+D+E+F+G
4.	A+B+C	F+G+H
5.	B+C+D	D+E

(...........)

15. ශ්‍රමයේ ආන්තික ඵලදාව, ශ්‍රමයේ සාමාන්‍ය ඵලදාවට වඩා අඩුවන විට,

1. ශ්‍රමයේ සාමාන්‍ය ඵලදාව ඉහළ නගී.
2. නිෂ්පාදනයේ ආන්තික පිරිවැය පහළ බසී
3. නිෂ්පාදනයේ සාමාන්‍ය විචල්‍ය පිරිවැය ඉහළ නගී
4. නිෂ්පාදනයේ ආන්තික පිරිවැය අවම අගයක් ගනී.
5. ශ්‍රමයේ මුළු ඵලදාව පහළ බසී. (...........)

16. වැඩෙන පරිමාණානුකූල ඵල නීතියෙන් ප්‍රකාශ කරනුයේ,

1. කර්මාන්ත ශාලාවේ විශාලත්වය වැඩිකරන විට, එහි ආන්තික ඵලදාව ක්‍රමයෙන් පහළ වැටෙන බවයි.
2. කර්මාන්ත ශාලාවේ විශාලත්වය වැඩිකරන විට, එහි සාමාන්‍ය පිරිවැය ක්‍රමයෙන් පහළ වැටෙන බවය.
3. කර්මාන්තශාලාවේ ධාරිතාව ප්‍රසාරණය කරන විට, එහි සාමාන්‍ය පිරිවැය ක්‍රමයෙන් ඉහළ නගින බවය.
4. ආයතනය ස්ථාවර යෙදවුම් ප්‍රමාණයක් සමග විචල්‍ය යෙදවුම ප්‍රසාරණය කරන විට එහි ආන්තික ඵලදාව වේගයෙන් ඉහළ නගින බවය.
5. ආයතනය විචල්‍ය යෙදවුම් ප්‍රමානයක් සමග ස්ථාවර යෙදවුම් වැඩිකරන විට එහි සාමාන්‍ය පිරිවැය ක්‍රමයෙන් පහළ වැටෙන බවය. (...........)

17. කතිපයාධිකාරී වෙළෙඳපොළක දැකිය හැකි ලක්ෂණය කුමක්ද?

1. වෙළෙඳපොලේ මුළු සැපයුමෙන් විශාල ප්‍රතිශතයක් හිමිකරගනු ලබන ආයතන අතලොස්සක් තිබීම.
2. නිෂ්පාදිතය සුවිශේෂී වූ ඒවා වීම.
3. ඒ ඒ ආයතනයේ ඉල්ලුම් වක්‍රය පූර්ණ නම්‍ය වීම.
4. වෙළෙඳපොලට නව ආයතන වලට ප්‍රවේශ වීමට බාධා නැත.
5. නිෂ්පාදන ආයතන දිගු කාලයේදී ප්‍රමාණික ලාභ හිමිකර ගැනීම. (...........)

18. කිසියම් නිෂ්පාදන ආයතනයක පිරිවැය හා ඉල්ලුම් තත්ත්වය පහත රූප සටහනෙන් පෙන්නුම් කෙරේ.



මෙම තොරතුරු වලට අනුව මෙම ආයතනයේ,

1. නිමැවුම Q_1 දී ලාභ උපරිම වේ
2. නිමැවුම Q_2 සිට Q_3 දක්වා වැඩි කරන විට ලාභ උපරිම වේ.
3. නිමැවුම් Q_3 සිට Q_2 දක්වා අඩුකරන විට ලාභ උපරිම වේ.
4. නිමැවුම Q_3 සිට Q_4 දක්වා ඉහළ නංවන විට ලාභ උපරිම වේ.
5. නිමැවුම Q_2 සිට Q_3 දක්වා වැඩිකරන විට ලාභ අඩුකරගනී. (...........)

19. සංක්‍රාම ඉපැයුම් සම්බන්ධව දී ඇති ප්‍රකාශ අතුරෙන් සදොස් ප්‍රකාශය කුමක්ද?
1. නිෂ්පාදන සාධකයක වර්තමාන භාවිතයේ ආවස්ථික පිරිවැය සංක්‍රාම ඉපැයුම් වේ.
2. වෙනත් නිෂ්පාදන කාර්යයකට නිෂ්පාදන සාධකයක් මාරුවීම වැළැක්වීමට අවශ්‍ය අවම ඉපැයුම සංක්‍රාම ඉපැයුම් වේ.
3. නිෂ්පාදන සාධකයක් සේවා නියුක්ත කරවීම සඳහා ගෙවිය යුතු අවම ගෙවීම සංක්‍රාම ඉපැයුම්වේ.
4. නිෂ්පාදන සාධක සේවාවක මිල මගින් පෙන්නුම් කෙරෙන්නේ සංක්‍රාම ඉපැයුම් වේ.
5. නිෂ්පාදන සාධකයක් පවත්නා භාවිතයෙහි රඳවා ගැනීම සඳහා අවශ්‍ය අවම ගෙවීම සංක්‍රාම ඉපැයුම් වේ. (...........)

20. ආර්ථිකයක විභව නිමවුම් මට්ටම ලෙස සැලකෙන්නේ,
1. උද්ධමන පීඩනයකින් තොරව ආර්ථිකයකට නිපදවිය හැකි තිරසාර නිමවුම් මට්ටම වේ.
2. ආර්ථිකයේ ඒ ඒ කාල වල පවතින සත්‍ය නිමවුම් මට්ටම වේ.
3. කෙටි කාලයක් තුළ ආර්ථිකයේ පවතින නිමවුම් මට්ටම වේ.
4. ආර්ථිකයක උත්පාත හා අවපාත පෙන්නුම් කරන නිමවුම් මට්ටම වේ.
5. ආර්ථිකයේ පවතින උපරිම නිමවුම් මට්ටම වේ. (...........)

21. ජාතික ගිණුම්වල ආදායම් ගිණුමෙහි ගෙවන ලද ලාභ නොගෙවූ ලාභ, ලාභමත බදු ප්‍රාග්ධන පරිභෝජනය යන සංරචකවල අගය එකතු කළ විට ලැබෙන්නේ,
1. බදු ආදායමයි
2. ශුද්ධ ලාභයයි
3. ව්‍යවසායකත්ව ලාභයයි
4. දළ ලාභයයි
5. රජයේ වියදමයි. (...........)

22. වෙළඳ මිලට දළ ජාතික නිෂ්පාදිතය නිවැරදිව ගණනය කරන ක්‍රමය හඳුනා ගන්න.
1. දළ දේශීය නිෂ්පාදිතය + විදේශ සාධක ලැබීම්
2. දළ දේශීය වියදම + ගෙවුම් ශේෂයේ වර්තන ශේෂය - ද්විතීය ආදායම් ශේෂය
3. දළ දේශීය වියදම + අපනයන - ආනයන
4. දළ දේශීය වියදම + ප්‍රාථමික ආදායම් ශේෂය
5. වැටුප් + පොලී + ලාභ + බදු + ප්‍රාථමික ආදායම් ශේෂය (...........)

23. රජයේ කටයුතු හා විදේශ වෙළඳාම නොමැති සරල ආර්ථිකයක පාරිභෝජන ශ්‍රිතය $C = 180 + 0.8\,Y$ ලෙසත් ස්වාධීන ආයෝජන වියදම් රු.බි. 400 ක් ලෙසත් වේ නම් මෙම ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායම කොපමණවේද?
1. රු.බි. 3900 2. රු.බි. 2900 3. රු.බි. 580 4. රු.බි. 390 5. රු.බි. 400 (...........)

24. පහත සඳහන් කවරක වැඩිවීමක් නිසා ආර්ථිකයක සමාහාර වියදමේ අඩුවීමක් හටගත හැකිද?,
1. ආයෝජන වියදම
2. පාරිභෝජන වියදම
3. ආණ්ඩුවේ මිලදී ගැනීම්
4. ආනයන වියදම
5. විදේශ ප්‍රේෂණ ගලා ඒම (...........)

25. ආන්තික ඉතුරුම් නැඹියාව වැඩිවීම
1. ගුණකයේ වටිනාකම අඩු කිරීමට හේතුවේ.
2. ගුණකයේ වටිනාකම වැඩිවීමට හේතුවේ.
3. ගුණකයේ වටිනාකම ස්ථාවරවීමට හේතුවේ.
4. ගුණකයේ වටිනාකමට බලපෑමක් සිදු නොවේ.
5. ගුණකයේ වටිනාකම අඩු හෝ වැඩිවීමට හේතුවේ. (...........)

26. ආන්තික ඉතුරුම් නැඹියාව 0.2 ක් සහිත ස්ථාවර බදු පමණක් දක්නට ලැබෙන ආර්ථිකයක ආණ්ඩුවේ මිලදී ගැනීම් රු.බි. 120 කින් ඉහළ යන විට නිමැවුම උපරිම වශයෙන් වැඩි වන්නේ,
1. රු.බි. 60 කිනි.
2. රු.බි. 600 කිනි.
3. රු.බි. 120 කිනි.
4. රු.බි. 240 කිනි.
5. රු.බි. 340 කිනි. (...........)

27. කිසියම් රටක මූර්ත පොලී අනුපාතය -6 ක් ලෙස සටහන් වී තිබුණේ නම් එයින් ගම්‍ය වන්නේ,
1. රටතුළ උද්ධමන අනුපාතය ශූන්‍ය අගයක් ගෙන තිබෙන බවයි.
2. මූර්ත ණය බර ඉහළ ගොස් ඇති බවයි.
3. උද්ධමනයට වඩා මූර්ත පොලී ඉහළ අගයක් ගෙන ඇති බවයි.
4. උද්ධමනයට වඩා නාමික පොලී අඩුවී ඇති බවයි.
5. පෞද්ගලික ඉතුරුම් වල පොලි අඩුවී ඇති බවයි. (...........)

28. සංචිත අනුපාතය 40% ලෙස නියම වූ බැංකු පද්ධතියක අධි සංචිත මිලියන 2400 ක් පවතින බව උපකල්පනය කරන්න. එම බැංකු පද්ධතියට උපරිම වශයෙන් ණය ප්‍රසාරණය කළ හැක්කේ,
1. මිලියන 3000 කින්ය.
2. මිලියන 2400 කින් ය.
3. මිලියන 6000 කින් ය.
4. මිලියන 9600 කින් ය.
5. මිලියන 3600 කින් ය. (...........)

29. කිසියම් වාණිජ බැංකුවක ඉල්ලුම් තැන්පතු 2400 ක් වන අතර, කොටස් ප්‍රාග්ධනය මිලියන 800 ක් වේ. පවතින සංචිත 1200 ක් වන අතර අධි සංචිත 240 ක් වේ. මෙම බැංකුවේ ණය ගුණකයේ අගය කොපමණද?
1. K = 20 2. K = 2.5 3. K = 4 4. K = 10 5. K = 5 (...........)

30. වාණිජ බැංකු තමන් සතු අධි සංචිත අඩු කිරිමට කටයුතු කරන විට මුදල් සැපයුමට කුමන ආකාරයේ බලපෑමක් සිදුවේද?
1. මුදල් සැපයුමට බලපෑමක් ඇති නොවේ.
2. මුදල් සැපයුම මන්දගාමී වේ.
3. මුදල් සැපයුම ශූන්‍ය වේ.
4. මුදල් සැපයුම වැඩිවේ.
5. මුදල් සැපයුම අඩුවේ. (...........)

31. කිසියම් රටක මුදලේ සංසරණ ප්‍රවේගය 2.5 ක් වන අතර, එරට මුදල් තොගය රු. මිලියන 200 ක් වේ. මෙම දත්ත වලට අනුව මෙම රටෙහි නාමික දළ දේශීය නිෂ්පාදිතය වන්නේ,
1. මිලියන 500 කි.
2. මිලියන 250 කි.
3. මිලියන 700 කි.
4. මිලියන 200 කි.
5. මිලියන 350 කි. (...........)

32. මූල්‍ය ප්‍රතිපත්ති යනුවෙන් අදහස් වන්නේ,
1. රාජ්‍ය ආදායම හා රාජ්‍ය වියදම සහ ණය පිළිබඳ ප්‍රතිපත්තිය වේ.
2. මුදල් පදනම පාලනයට අදාළ ප්‍රතිපත්ති වේ.
3. මිල ගණන් හා ආදායම් කළමනාකරණයට අදාළ ප්‍රතිපත්ති වේ.
4. මුදල් සැපයුම සහ පොලී අනුපාතය පාලනය කිරීමට අදාළ ප්‍රතිපත්ති වේ.
5. අයවැය ලේඛනයට අදාළ ප්‍රතිපත්ති වේ. (...........)

33. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ප්‍රධාන මූල්‍ය අතරමැදි ආයතන වලින් ජාතික මට්ටමේ බලපත්‍රලාභී විශේෂිත බැංකුව හඳුනාගන්න.
1. සමුපකාර ග්‍රාමීය බැංකු
2. සකසුරුවම් හා සමුපාකර ණය දෙන සමිති
3. සමෘද්ධි බැංකු සංගම්
4. සණස සංවර්ධන බැංකු
5. මහජන බැංකුව (...........)

34. මධ්‍යම බැංකුවක් විසින් වෙළඳපොලේ සුරකුම්පත් විකිණීමක් නිසා මුදල් සැපයුමට සහ පොලී අනුපාතයට කෙබඳු බලපෑමක් සිදුවේද?

	පොලී අනුපාතය	මුදල් සැපයුම
1.	නොවෙනස් වේ	වැඩිවේ
2.	අඩුවේ	අඩුවේ
3.	ස්ථාවරවේ	වැඩිවේ
4.	වැඩිවේ	වැඩිවේ
5.	වැඩිවේ	අඩුවේ

(...........)

35. ශුද්ධ පොදු භාණ්ඩයක දැකිය හැකි ලක්ෂණයක් නොවන්නේ,
1. පරිභෝජනයේ තරගකාරීත්වයක් නොමැතිවීම.
2. ප්‍රතිලාභ ලබන්නන් සීමා කළ නොහැකිවීම.
3. සාමූහිකව පරිභෝජනය කළ හැකිවීම.
4. මිල නොගෙවන අය පරිභෝජනයෙන් ඉවත්කළ නොහැකිවීම.
5. අතිරේක පුද්ගලයෙකුට සැපයීමේදී ආන්තික පිරිවැයක් පැවතීම. (...........)

36. දළ දේශිය නිෂ්පාදිතය වාර්ෂිකව වැඩිවීමට සාපේක්ෂව රාජ්‍ය ආදායම වැඩිවීම අතර සම්බන්ධතාව මැන දැක්වීමට යොදාගන්නා මිනුම් වන්නේ,
1. සාමාන්‍ය බදු අනුපාතිකයයි.
2. බදු ආදායමේ සංවේදිතා සංගුණකයයි.
3. බදු අවධානම් සංගුණකයයි.
4. ආන්තික බදු නැම්යා අනුපාතිකයයි.
5. බදු අනුකූලතා සංගුණකයයි. (...........)

37. 2016 වර්ෂයේ මහ බැංකු වාර්තාවට අනුව 2016 වර්ෂයේ බදු ආදායම හා බදු නොවන ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
1. 12.4 හා 1.8 කි.
2. 12.4 හා 0.4 කි.
3. 14.3 හා 2.1 කි.
4. 14.3 හා 1.8 කි.
5. 13.3 හා 0.1 කි. (...........)

38. ව්‍යාපාර චක්‍රයක ප්‍රසාරණ අවධියේදී ආදායම ඉහළයත්ම පෞද්ගලික බදු ගෙවීම් සහ සංක්‍රාම ගෙවීම් සහ අනෙකුත් සමාජ රක්ෂණ ගෙවීම් ද ඊට අනුරූපීව නිරායාසයෙන්ම හැඩ ගැසෙයි නම් එවැනි රාජ්‍ය මූල්‍ය ප්‍රතිප්තියක් හඳුන්වන්නේ කෙසේද?
1. මධ්‍යස්ත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක් ලෙසය.
2. ස්වයංක්‍රීය රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක් ලෙසය.
3. අභිමතානුසාරී රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තික් ලෙසය.
4. ප්‍රසාරණාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක් ලෙසය.
5. සංකෝචනාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක් ලෙසය (...........)

39. ශ්‍රී ලංකා රජයේ වර්තන වියදම් වල ප්‍රධාන සංරචක (2016) රාජ්‍ය වියදම් තුළ ඒවා දරණ සාපේක්ෂ වැදගත්කම අනුව පෙළගස්වනු ලැබුවහොත් ඒවායේ අනු පිළිවෙල,
1. කුටුම්බ පැවරුම්, වැටුප් හා වේතන, පොලී ගෙවීම්.
2. කුටුම්බ පැවරුම්, රාජ්‍ය සංස්ථා හා ආයතන වෙත පැවරුම්, පොලී ගෙවීම්.
3. පොලී ගෙවීම්, වැටුප් හා වේතන, කුටුම්බ වෙත පැවරුම්
4. වැටුප් හා වේතන, කුටුම්බ පැවරුම්, පොලී ගෙවීම්
5. වැටුප් හා වේතන, පොලී ගෙවීම්, රාජ්‍ය ආයතන හා සංස්ථා වෙත පැවරුම් (...........)

40. රෙදි නිෂ්පාදනය කිරීමෙහි ලා ඉන්දියාවට වඩා ඇමරිකාවට නිරපේක්ෂ වාසි තිබේ නම්,
1. රෙදි සඳහා ඉන්දියාවේ ඉහළ මිලක් පවතිනු ඇත.
2. රෙදි සඳහා ඇමරිකාවේ ඉහළ මිලක් පවතිනු ඇත.
3. ඉන්දියාවට වඩා වැඩියෙන් රෙදි නිෂ්පාදනය කිරීමට ඇමරිකාවට හැකි වනු ඇත.
4. රෙදි නිෂ්පාදනය කිරීමේ ආවස්ථික පිරිවැය ඉන්දියාවට වඩා ඇමරිකාවේ අඩුය.
5. ඉන්දියාවට වඩා අඩු සම්පත් පිරිවැයකින් රෙදි ඒකකයක් නිෂ්පාදනය කිරීමට ඇමරිකාවට හැකිවනු ඇත.

(...........)

41. රටක වෙළඳ අනුපාතය අයහපත් වීමට බලපාන හේතුවක් නොවන්නේ,
   1. අපනයන මිල අඩුවී ආනයන මිල වැඩිවීම
   2. අපනයන මිල ආනයන මිලට වඩා වේගයෙන් පහළ යාම.
   3. අපනයන මිල ආනයනන මිලට වඩා වැඩි වේගයෙන් ඉහළ යාම.
   4. අපනයන මිල ස්ථාවරව තිබියදී ආනයන මිල ඉහළ යාම.
   5. ආනයන මිල ස්ථාවරව තිබියදී අපනයන මිල පහළ යාම. (...........)

42. 2016 වර්ෂයේ ශ්‍රී ලංකාවේ වැඩිම අපනයන ගැනුම්කරු බවට පත්ව ඇත්තේ,
   1. ඇමරිකා එක්සත් ජනපදය 2. ආසියාව
   3. මැද පෙරදිග රටවල් 4. ජර්මනිය
   5. එක්සත් රාජධානිය (...........)

43. X නැමති භාණ්ඩයේ ආනයනික මිල රු. 5000/- කි. එම භාණ්ඩය මත පැනවූ තිරු බද්ද 20% කි. එම භාණ්ඩයේ ආනයනික යෙදවුම් මිල රු. 4000 ක් වන අතර දේශීය මිල ද රු. 5000/- කි. මෙම භාණ්ඩයේ සඵල ආරක්ෂණ අනුපාතය කොපමණ වේද?
   1. 100% කි 2. 20% කි 3. 80% කි 4. 50% කි 5. 200% කි (...........)

44. වර්තමානයේ ජාත්‍යාන්තර මූල්‍ය අරමුදලේ සංචිත වත්කම වන විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි) (SDR) ඒකකයක වටිනාකම තීරණය කෙරෙන මුදල් පැස කුමක්ද?
   1. ස්ටර්ලිං පවුම, ජපන් යෙන්, යුරෝ, ඇමරිකන් ඩොලර්
   2. ස්ටර්ලිං පවුම, ජපන් යෙන්, ප්‍රංශ ප්‍රෑන්ක්, ඇමරිකන් ඩොලර්
   3. යුරෝ, ජපන් යෙන්, සිංගප්පූරු ඩොලර්, ඉන්දියන් රුපියල්
   4. ස්ටර්ලිං පවුම, යුරෝ, සිංගප්පූරු ඩොලර්, ජපන් යෙන්
   5. ඇමරිකන් ඩොලර්, ජපන් යෙන්, ප්‍රංශ ප්‍රෑන්ක්, ජර්මන් ඩොයිෂ් මාර්ක් (..........)

45. කිසියම් රටක ආර්ථික වෘද්ධි අනුපාතයෙන් මැනෙනුයේ,
   1. සම්පත් වැඩිවීමේ සීඝ්‍රතාවයයි 2. නාමික ජාතික ආදායමේ වැඩිවීමයි
   3. ප්‍රතිශීර්ෂ ආදායමේ වෙනස්වීමයි 4. ඵලදායිතාවයේ වෙනස්වීමයි.
   5. නිමවුම වෙනස්වීමේ සීඝ්‍රතාවයයි. (...........)

46. ශ්‍රම බලකාසහභාගිත්ව අනුපාතය යනු,
   1. ශ්‍රම බලකාය වැඩකළ හැකි වයසේ ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස දැක්වීමයි.
   2. සේවා වියුක්ත පුද්ගලයන්ගේ සංඛ්‍යාව ශ්‍රම හමුදාවේ ප්‍රතිශතයක් ලෙස දැක්වීමයි.
   3. විරැකියා අනුපාතය ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස දැක්වීමයි.
   4. වැඩකළ හැකි වයසේ ජනගහණය ශ්‍රම බලකායේ අනුපාතයක් ලෙස දැක්වීමයි.
   5. ශ්‍රම හමුදාව මුළු ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස දැක්වීමයි. (...........)

47. යම් දෙන ලද වර්ෂයක රටක නාමික දළ දේශීය නිෂ්පාදිතය 8% කින් වර්ධනය වූ අතර උද්ධමනය 4.2% කින් වර්ධනය විය. එම රටේ ජනගහණය 1.8% ක් වර්ධනය වූයේ නම් මූර්ත ඒක පුද්ගල ආදායම වර්ධනය වන්නේ ආසන්න වශයෙන් කොපමණකින්ද?
   1. 0% කින් 2. 2% කින් 3. 2.5% කින් 4. 5.0% කින් 5. 14% කින් (...........)

48. සමාජයේ දුප්පත්ම 20% වෙතින් ධනවත්ම 20% වෙත ආදායම් ව්‍යාප්තියක් සිදුවීම නිසා ලෝරන්ස් වක්‍රය
   1. 45^0 රේඛාවට ආසන්න වන අතර ගිනි සංගුණකය ඉහළ යයි.
   2. 45^0 රේඛාවට ආසන්න වන අතර ගිනි සංගුණකය පහළ යයි.
   3. 45^0 රේඛවෙන් ඈත්වන අතර ගිනි සංගුණකය ඉහළ යයි.
   4. 45^0 රේඛාවෙන් ඈත් වන අතර ගිනි සංංගුණකය පහළ යයි.
   5. 45^0 රේඛාව මතට යන අතර සංගුණකය ශුන්‍ය වේ. (...........)

49. මානව සංවර්ධන දර්ශකයට අනුව ශ්‍රී ලංකාවේ 2015 වර්ෂයට අදාළ අගය සහ රටවල් 188 කින් ලබාගෙන ඇති ස්ථානය වන්නේ,

	HDI අගය	**ශ්‍රී ලංකාවට හිමි ස්ථානය**
1.	0.550	71
2.	0.751	73
3.	0.731	71
4.	0.766	73
5.	0.678	93

(...........)

50. යැපුම් අනුපාතය ලෙස සැලකෙන්නේ,
1. වයස අවු. 15 - 59 වයසේ ජනගහනයට වයස අවුරුදු 15 ට අඩු සහ අවුරුදු 59 ට වැඩි ජනගහනයේ අනුපාතයයි
2. වයස අවුරුදු 15 ට වැඩි ජනගහනයට වයස අවු. 15 ට අඩු ජනගහනයේ අනුපාතයයි.
3. වැඩ කරන වයසේ ජනගහනයෙන් පුද්ගලයන් 100 කට වයස අවුරුදු 65 ට වැඩි ජනගහනයේ අනුපාතයයි.
4. ශ්‍රම හමුදාවේ සේවා නියුක්ත ජනගහනයට සේවා වියුක්ත ජනගහනයේ අනුපාතයයි.
5. වැඩිහිටි ජනගහනයට ළමා ජනගහනයේ අනුපාතයයි. (...........)

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

21 S II

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

Third Term Test - Grade 13 - 2018

විභාග අංකය ....

ආර්ථික විද්‍යාව II

කාලය පැය තුනයි

❖ ''අ '' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්ද ''ආ'' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

අ උප කොටස

01). i. පහත දැක්වෙන ආර්ථික සිදුවීම් නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයකින් පෙන්වන්නේ කෙසේද?

(අ) ආර්ථිකය සතු සම්පත් ඌන උපයෝජන අවස්ථාවක්

(ආ) කෘෂිකාර්මික භාණ්ඩ නිෂ්පාදනය සඳහා නව සොයා ගැනීමක්

(ඇ) වෙළඳපොළ ඉල්ලුම අඩුවීම හේතුවෙන් Y භාණ්ඩයේ සම්පත් ඌනසේවා නියුක්ත වීම

(ඉ) කර්මාන්ත ශාලාවක තම නිෂ්පාදන හැකියාව 50% ක වර්ධනයක් ඇති කරගැනීම (ලකුණු 4)

ii. ආර්ථික පද්ධති වර්ග කිරීමේ නිර්ණායක දක්වමින් එම නිර්ණායක යටතේ විකල්ප ආර්ථික පද්ධති වර්ගීකරණය කරන්න. (ලකුණු 4)

iii. මධ්‍යගත සැලසුම් ආර්ථිකයක් සැමවිටම සමාජ සුබසාධනය සඳහා ක්‍රියාත්මක වේ. මෙම ප්‍රකාශය විමසන්න. (ලකුණු 4)

iv. අනාගතය සඳහා සම්පත් වෙන්කරන්නේ කෙසේද? යන නවතම මූලික ආර්ථික ප්‍රශ්නයක් ගැන කථා කෙරේ. මෙයින් කුමක් වැටහේද? ඒ සඳහා ක්‍රියාකළ යුත්තේ කෙසේද? (ලකුණු 4)

v. රටක මානව සම්පත ප්‍රවර්ධනය කළ හැකි ක්‍රම මොනවාද? (ලකුණු 4)

02). i. ඉල්ලුමට බලපාන අනෙකුත් සාධක ස්ථාවරව තිබියදී සාමාන්‍ය භාණ්ඩයක මිල අඩුවන විට ඉල්ලුම් ප්‍රමාණය වෙනස්වීම කෙරෙහි ධන ආදායම් හා ආදේශන ප්‍රතිවිපාක හේතුවන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 4)

ii. පහත සඳහන් අවස්ථා වලදී නිෂ්පාදකයාගේ මුළු අයභාරයට කුමක් සිදුවේද?

(අ) අත්‍යාවශ්‍ය භාණ්ඩයක මිල වැඩිවීම

(ආ) සුඛෝපභෝගී භාණ්ඩයක මිල වැඩිවීම

(ඉ) අත්‍යාවශ්‍ය භාණ්ඩයක මිල අඩුවීම

(ඊ) සුඛෝපභෝගී භාණ්ඩයක මිල අඩුවීම (ලකුණු 4)

iii. ''සහල් සඳහා වෙළඳපොල සැපයුම වැඩි වුවද සහල් මිල වැඩි විය''. රූප සටහනක් ඇසුරින් මෙවැනි තත්ත්වයක් හට ගැනීමට හේතුව පැහැදිලි කරන්න. (ලකුණු 4)

iv. එක්තරා භාණ්ඩයක් සඳහා ඇති වෙළඳපොළ ඉල්ලුම් හා සැපයුම් ලේඛන පහත පරිදි වේ.

ඒකකයක මිල (රු.)	ඉල්ලුම් ප්‍රමාණය (ඒකක)	සැපයුම් ප්‍රමාණය (ඒකක)
40	160	40
60	120	60
80	80	80
100	40	100
120	0	120

(අ) වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම් වක්‍ර ප්‍රස්තාර සටහනකින් පෙන්නුම් කරන්න. (ලකුණු 2)

(ආ) වෙළෙඳපොල සමතුලිතයේදී ඉල්ලුමේ හා සැපයුමේ මිල නම්‍යතාව ගණනය කරන්න. (ලකුණු 2)

(ඇ) සමතුලිතයේ දී හට ගන්නා නිෂ්පාදන අතිරික්තයේ ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 2)

(ඉ) ඒකකයක් රුපියල් 100 ක් ලෙස අවම මිලක් මෙම භාණ්ඩය සඳහා ආණ්ඩුව විසින් ප්‍රකාශයට පත්කර අතිරික්තය රජය මිලදී ගැනීමේ මිල ආධාරක ප්‍රතිපත්තිය මගින් අවම මිල සහතික කරනුලැබේ යැයි සලකන්න. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් නිෂ්පාදක අතිරික්තයේ හට ගන්නා වෙනස කොපමණද? (ලකුණු 2)

03). i. කිසියම් නිෂ්පාදන ආයතනයක ගණකාධිකාරිවරයා විසින් ගිණුම් තබන පිරිවැයට වඩා ආර්ථික පිරිවැය විශාල වේ නම් ඉන් අදහස් කෙරෙන්නේ කුමක්ද? පැහැදිලි කරන්න. (ලකුණු 4)

ii. නිෂ්පාදක අතිරික්තය හා ආර්ථික බදු කුලිය යන සංකල්ප අතර වෙනස රූප සටහන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

iii. පූර්ණ තරගය හා ඒකාධිකාරී තරගය යන වෙළෙඳපොල තත්ත්ව අතර දැකිය හැකි අසමානතා සඳහන් කරන්න. (ලකුණු 4)

iv. පූර්ණතරගකාරී නිෂ්පාදන ආයතනයක් කිලෝ ග්‍රෑම් එකක් රු. 60 ක් වන මිලට රතු කැකුලු සහල් 180 Kg ක් සතියක් තුළ අලෙවි කරයි. මේ සඳහා ආයතනය දරන පිරිවැය පහත පරිදි වේ.

මුළු විචල්‍ය පිරිවැය රු. 9600
මුළු ස්ථාවර පිරිවැය රු. 1200
ආන්තික පිරිවැය රු. 60

(අ) ආයතනය සතියකදී ලබන ආර්ථික ලාභය හා ඒකකයක නිෂ්පාදන පිරිවැය ගණනය කරන්න. (ලකුණු 4)

(ආ) මෙවැනි ලාභ තත්ත්වයක් යටතේ පවතින ආයතන වෙළෙඳපොළෙන් ඉවත්වේද? නව ආයතන වෙළෙඳපොළට ප්‍රවේශවේද? ඔබේ පිළිතුරට හේතුව පැහැදිලි කරන්න. (ලකුණු 4)

04). i. ජාතික ගිණුම් දත්ත වල ප්‍රධාන භාවිත මොනවාද? (කරුණු 4 ට ලකුණු 2)

ii. රටක ආර්ථික වෘද්ධි අනුපාතය යනුවෙන් කුමක් අදහස්වේද? එය ගණනය කරන ආකාර මොනවාද? (ලකුණු 4)

iii. ජාතික ගිණුම් ඇස්තමේන්තු කිරීමේදී ගෙවුම් ශේෂයේ වර්තන ශේෂය ජාතික ගිණුම් හා සම්බන්ධ වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (වියදම් ගිණුම ඇසුරින්) (ලකුණු 4)

iv. දළ දේශීය නිමවුම ගණනය කිරීමේදී බැහැර කරන ඵලදායී නොවන ගනුදෙනු ලෙස ඔබ සලකන්නේ මොනවාද? (කරුණු 4 ට ලකුණු 2)

v. පහත දැක්වෙන්නේ ජාතික ගිණුම් පිළිබඳ දත්ත කිහිපයකි.

ශුද්ධ පොලී	60
බදු කුලී	80
විදේශ ශුද්ධ සාධක ආදායම	-20
සමාගමික ලාභ මත බදු	150
සේවා නියුක්ති ආදායම්	50
ගෙවන ලද ලාභ	30
විදේශ ශුද්ධ වර්තන සංක්‍රාම	300
නොගෙවූ ලාභ	40
ස්වයං සේවා නියුක්ති ආදායම්	120
ශුද්ධ වක්‍ර බදු	10
ප්‍රාග්ධන පරිභෝජන වියදම්	25

ඉහත දත්ත පදනම් කර ගනිමින් පහත සඳහන් ගිණුම් සංකල්ප ගණනය කරන්න.

(අ) දළ දේශීය ආදායම (ලකුණු 2)

(ආ) වෙළඳ මිලට දළ ජාතික නිෂ්පාදිතය (ලකුණු 2)

(ඇ) වැයකළ හැකි ශුද්ධ ජාතික ආදායම (ලකුණු 2)

(ඈ) දළ ලාභය (ලකුණු 2)

05). i. සමාහාර ඉල්ලුම් හා සමාහාර සැපයුම් වක්‍ර භාවිතයෙන් සමතුලිතය තීරණය වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 4)

ii. විවෘත ආර්ථිකයක ආදායමේ වෘත්ත ප්‍රවාහය තුළ ඇතුළත් විදීම් හා කාන්දුවීම් යන්නෙන් කුමක් අදහස් වේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 4)

iii. රටක සාර්ව ආර්ථික සමතුලිතය වෙනස්වීමට බලපාන සාධක මොනවාද? (ලකුණු 4)

iv. කල්පිත ආර්ථිකයකට අදාළ සාර්ව ආර්ථික දත්ත කීපයක් පහත දැක්වේ.

පරිභෝජනය $C = 150 + 0.75\ Yd$

ආයෝජනය $I = 200$

ආණ්ඩුවේ මිලදී ගැනීම් $G = 100$

බදු අයකිරීම් $T = 60$

(අ) මෙම ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායම් මට්ටම නිර්ණය කරන්න (ලකුණු 2)

(ආ) ආයොජන වියදම් රු.බි. 400 දක්වා ඉහළ ගියහොත් නව සමතුලිත ආදායම් මට්ටම කොපමණද? (ලකුණු 2)

(ඇ) රජයේ වියදම් ගුණකයේ අගය සොයන්න. (ලකුණු 2)

(ඉ) මෙම ආර්ථිකයේ ස්වායත්ත වියදම් වර්ග මොනවාද? (ලකුණු 2)

<u>ආ උප කොටස</u>

06). i. ඉල්ලුම් තැන්පතු සහ ආදේශ මුදල් අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)

ii. ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතිකය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 3)

iii. ප්‍රතිපත්ති පොලී අනුපාතිකවල වෙනස්වීම් මිල මට්ටම හා නිමැවුම කෙරෙහි බලපාන ක්‍රියාවලිය විස්තර කරන්න. (ලකුණු 4)

iv. කොටස් වෙළඳපලේ තැරැව්කාර ආයතනයක් විසින් මහ බැංකුවට පිළිණපත් විකිණීම මගින් ලබාගත් රු.මි. 20000 ක මුදලක් වාණිජ බැංකුවක තැන්පත් කළ බව සිතන්න.

(අ) මෙම ගනුදෙනුව හේතුවෙන් මුදල් සැපයුමට කෙබඳු බලපෑමක් ඇති කරයිද? (ලකුණු 3)

(ආ) සංචිත අනුපාතය 25% ක් නම් මෙම ක්‍රියාව හේතුවෙන් සමස්ත බැංකු පද්ධතියට අතිරේක ණය කොපමණ ලබාදිය හැකිද? (ලකුණු 3)

(ඇ) එබඳු ණය ප්‍රසාරණයක් සිදු නොවීම සඳහා අදාළ වන මූලික කොන්දේසි මොනවාද? (ලකුණු 3)

07). i. පොදු භාණ්ඩ වෙළඳපොලෙන් නොසැපයිමට හේතු දෙකක් සඳහන් කරන්න (ලකුණු 2)

ii. ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය තත්ත්වය තුළ දක්නට ලැබෙන දුර්වලතා මොනවාද? (ලකුණු 4)

iii. සාමාන්‍ය බදු අනුපාතිකය හා ආන්තික බදු අනුපාතිකය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)

iv. රාජ්‍ය අයවැයෙහි අතුරු සම්මත ගිණුමක් යනුවෙන් අදහස් වන්නේ කුමක්ද? අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කරන්නේ කුමන අවස්ථාවලදීද? (ලකුණු 4)

v. රාජ්‍ය ණයෙහි ආර්ථික ප්‍රතිවිපාක ගෙන හැර දක්වන්න. (ලකුණු 4)

vi. ශ්‍රී ලංකාවේ රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වය පිළිබඳ ව්‍යාපෘති සඳහා නිදසුන් දෙකක් ඉදිරිපත් කරන්න. (ලකුණු 2)

08). i. අන්තර් ජාතික වෙළඳාමට පදනම් වූ සාපේක්ෂ වාසි න්‍යාය හා නිරපේක්ෂ වාසි න්‍යාය අතර වෙනස උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 4)

ii. නව ගෙවුම් තුළන ඉදිරිපත් කිරිමට අනුව සමස්ථ ශේෂය අර්ථ දක්වා එය ගණනය කරන ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 4)

iii. ද්විත්ව සටහන් මූලධර්මයට අනුව පහත දැක්වෙන ගණුදෙනු ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂ ලේඛනයේ හර සහ බැර වශයෙන් වාර්තා කරන ආකාරය දක්වන්න.

(අ) ඇමරිකානු ඩොලර් 400 ක ඇඟලුම් ඇමරිකාවට අපනයනය කිරීම

(ආ) දේශීය සමාගමක් විදේශ රටක ඇඟලුම් කර්මාන්ත ශාලාවක් ඩොලර් 1000 ක් යොදා ආරම්භ කිරීම

(ඇ) ඩොලර් මිලියන 15 ක ආයෝජන ආදායමක් ලැබීම

(ඉ) ජපන් ආයෝජකයෙකු ඩොලර් මිලියන 10 ක් වටිනා කොටස් කොළඹ කොටස් හුවමාරුවෙන් මිලට ගැනීම (ලකුණු 4)

iv. නිදහස් වෙළඳාම සීමා කරන තීරුබදු නොවන වෙළඳ බාධක 4 ක් සඳහන් කරන්න (ලකුණු 4)

v. සංචිත වත්කම් යන්නෙන් කුමක් අදහස් වේද? ඊට ඇතුළත්කරන වත්කම් මොනවාද? (ලකුණු 4)

09). i. ආර්ථික වෘද්ධිය යනුවෙන් කුමක් අදහස්වේද? එය මනිනු ලබන්නේ කෙසේද? (ලකුණු 4)

ii. රටක ඵලදායිතා මට්ටම තීරණය කරන ප්‍රධාන සාධක මොනවාද? (ලකුණු 4)

iii. වර්තමාන ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යවසායකගේ අකාර්යක්ෂමතා රාශියක් දක්නට ලැබේ. ඒ සඳහා බලපෑ සාධක මොනවාද? (ලකුණු 4)

iv. වර්තමාන ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහයේ වෙනස්කම් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශත සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 4)

v. ඌණ සේවා නියුක්තිය යනුවෙන් කුමක් අදහස්වේද, එහි ලක්ෂණ මොනවාද? (ලකුණු 4)

10). i. මානව සංවර්ධන දර්ශයේ සංරචක නම් කරන්න. (ලකුණු 3)

ii. මානව සංවර්ධනය මත රටවල් වර්ගීකරණය කර දක්වන්න. (ලකුණු 4)

iii. ශ්‍රී ලංකාවේ තරගකාරිත්වය වැඩි දියුණු කිරීම සඳහා ගතයුතු පියවර 4 ක් නම් කරන්න (ලකුණු 4)

iv. 2015 න් පසු අත්කර ගැනීමට අපේක්ෂිත තිරසාර සංවර්ධන අරමුණු හතරක් නම් කරන්න. (ලකුණු 4)

v. තිරසාර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම උදෙසා වර්තමාන ශ්‍රී ලංකා රජය ගෙන ඇති පියවර මොනවාද? (ලකුණු 5)

2018 - තෙවන වාර පරීක්ෂණය
13 ශ්‍රේණිය - ආර්ථික විද්‍යාව

<u>පිළිතුරු පත්‍රය</u>

I කොටස

1)	5	11)	2	21)	4	31)	1	41)	3
2)	1	12)	1	22)	2	32)	4	42)	1
3)	2	13)	4	23)	2	33)	4	43)	1
4)	1	14)	1	24)	4	34)	5	44)	1
5)	5	15)	3	25)	1	35)	5	45)	5
6)	1	16)	2	26)	2	36)	2	46)	1
7)	3	17)	1	27)	4	37)	1	47)	2
8)	2	18)	2	28)	3	38)	2	48)	3
9)	5	19)	4	29)	2	39)	3	49)	4
10)	5	20)	1	30)	4	40)	5	50)	1

II කොටස

<u>අ උප කොටස</u>

01). **i.** **පහත දැක්වෙන ආර්ථික සිදුවීම් නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයකින් පෙන්වන්නේ කෙසේද?**
(අ) ආර්ථිකය සතු සම්පත් ඌන උපයෝජන අවස්ථාවක්
(ආ) කෘෂිකාර්මික භාණ්ඩ නිෂ්පාදනය සඳහා නව සොයා ගැනීමක්
(ඇ) වෙළඳපොළ ඉල්ලුම අඩුවීම හේතුවෙන් Y භාණ්ඩයේ සම්පත් ඌනසේවා නියුක්ත වීම
(ඉ) කර්මාන්ත ශාලාවක තම නිෂ්පාදන හැකියාව 50% ක වර්ධනයක් ඇති කරගැනීම **(ලකුණු 4)**

ii. ආර්ථික පද්ධති වර්ග කිරීමේ නිර්ණායක දක්වමින් එම නිර්ණායක යටතේ විකල්ප ආර්ථික පද්ධති වර්ගීකරණය කරන්න. **(ලකුණු 4)**

iii. මධ්‍යගත සැලසුම් ආර්ථිකයක් සැමවිටම සමාජ සුබසාධනය සඳහා ක්‍රියාත්මක වේ. මෙම ප්‍රකාශය විමසන්න. **(ලකුණු 4)**

iv. අනාගතය සඳහා සම්පත් වෙන්කරන්නේ කෙසේද? යන නවතම මූලික ආර්ථික ප්‍රශ්නයක් ගැන කථා කෙරේ. මෙයින් කුමක් වැටහේද? ඒ සඳහා ක්‍රියාකළ යුත්තේ කෙසේද? **(ලකුණු 4)**

v. රටක මානව සම්පත ප්‍රවර්ධනය කළ හැකි ක්‍රම මොනවාද? **(ලකුණු 4)**

01). i. (අ)



(ආ)



(ඇ)



(ඉ)



(ල. 1 බැගින් ල. 4)

ii. - සම්පත් හිමිකාරිත්වය අනුව වර්ග කිරීම.
- සම්පත් බෙදා වෙන්කිරීමේ යාන්ත්‍රණය (තීරණ සම්බන්ධීකරණය යාන්ත්‍රණය) අනුව වර්ග කිරීම
- සානුබලවල ස්වභාවය අනුව
- ආදායම් පුනර් ව්‍යාප්තිය හා සමාජ ආරක්ෂණ ජාල අනුව
- ආගමික දර්ශන හා දෘෂ්ටිවාද අනුව

සම්පත් හිමිකාරිත්වය අනුව,
- ධනේෂ්වර ආර්ථික ක්‍රම - සමාජවාදී ආර්ථික ක්‍රම
- සම්පත් බෙදා වෙන් කිරීමේ යාන්ත්‍රණය අනුව
  - සම්ප්‍රදායික ආර්ථික පද්ධති
  - වෙළඳපල ආර්ථික පද්ධති
  - විධානගත ආර්ථික පද්ධති

සානුබලවල ස්වභාවය අනුව
- ද්‍රව්‍යාත්මක සානුබල - වෙළඳපල ආර්ථික පද්ධති
- සදාචාරාත්මක සානුබල අනුව - සම්ප්‍රදායික ආර්ථික පද්ධති
- බලය පදනම්කරගත් සානුබල - විධානගත ආර්ථික පද්ධති

ආදායම් පුනර්ව්‍යාප්තිය හා සමාජ ආරක්ෂන ජාල අනුව

- සමාජ වෙළඳපල ආර්ථික (වෙළඳපල ආර්ථික + සමාජ සාධාරණත්වය) (ජර්මනිය, ස්වීඩනය)

ආගමික දර්ශන හා දෘෂ්ඨිවාද අනුව

- නව සම්ප්‍රදායික ආර්ථික පද්ධති - උදා- ඉස්ලාම් මූලධර්මවාදය, (ඉරානය, පකිස්තානය, ඉරාකය)

(කරුණු 1 කට ලකුණු 1 බැගින් ලකුණු 4)

iii. - සැලසුම්ගත ආර්ථිකයක් යනු මූලික ආර්ථික ප්‍රශ්න මධ්‍යගත සැලසුම් අධිකාරිය මගින් හෝ කිසියම් බලධාරියෙකු විසින් දෙනු ලබන නියෝග මගින් හෝ විසඳන ක්‍රමයකි.
- සැලසුම්ගත ආර්ථිකයක තීරණ ගැනීමක් මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීමට ගනු ලබන තීරණ මධ්‍යගතවීම නිසා එය හැසිරවීම සඳහා මධ්‍යගත සැලසුම් මණ්ඩලය ක්‍රියාත්මක වේ.
- භාණ්ඩ හා සේවා නිෂ්පාදනයේදී සමාජීය සුභසාධනය පමණක් සැලකිල්ලට ගැනීම.
- ආණ්ඩුවේ මැදිහත්වීම මත නිෂ්පාදන සාධක ඇතුළු නිෂ්පාදන අවධි සැලසුමකට අනුව ක්‍රියාත්මක කිරීම.
- ආදායම් හා ධන ව්‍යාප්තිය සාධාරණ වීම.
- බලය පදනම් කරගත් සානුබල පැවතීම
- ප්‍රමාණවත් සම්පත් ප්‍රමාණයක් පොදු භාණ්ඩ සැපයීමට යොමු කිරීම
- සමාජ ප්‍රතිලාභ මත නිෂ්පාදනය මෙහෙයවීම.
- සූරා කෑමේ ලක්ෂණ අවම වීම.

මෙවැනි ලක්ෂණ සැලසුම් ආර්ථිකයක පැවතීම නිසා සැලසුම් ආර්ථිකයක් බොහෝ දුරට සමාජ සුබ සාධනය සඳහා ක්‍රියාත්මක වන බව පෙන්වා දියහැකිය. (සුදුසු කරුණු 4 ක් මගින් පිළිතුර සනාථ කිරීමට ලකුණු 4)

iv. - මෙයින් අදහස් කරන්නේ හිග සම්පත් අනාගතය හා වර්තමානය අතර බෙදාගත යුත්තේ කෙසේද යන්නයි. (ලකුණු 1)
- වේගවත් ආර්ථික වෘද්ධියක් සඳහා පවතින සම්පත් විශාල වශයෙන් උපයෝජනය කළවිට අනාගතයේදී ගැටළු මතුවේ. වේගයෙන් වනාන්තර එළිපෙහෙළි කළවිට ඉදිරි කාලයේදී කාලගුණ විපර්යාස අතිවීම නිදසුනක් ලෙස සඳහන් කළ හැකිය. (ලකුණු 1)
- තිරසාර සංවර්ධනය ලෙස හඳුන්වන්නේද කොපමණ සම්පත් ප්‍රමාණයක් වර්තමානයේ භාවිත කරනවාද කොපමණ අනාගතයට වෙන්කරනවාද යන තීරණ ගැනීමයි.
එනම් වර්තමානයේ සම්පත් භාවිත කළ යුත්තේ අනාගත පරම්පරාවට හානියක් නොවන ආකාරයටයි (ල. 1)
- අනාගතය සඳහා සම්පත් වෙන්කළ යුත්තේ දැනට තිබෙන සීමා හා නිශ්චිත ස්වාභාවික සම්පත්, භෞතික සම්පත්, මානව සම්පත් පිරිමැසුම් සහිතව භාවිත කිරීමත් තිබෙන සම්පත් වැඩිකර ගැනිමත්ය. (ල.1)

v. - ආකල්ප සංවර්ධනය කිරීම - අධ්‍යාපනය ලබාදීම - පුහුණුව ලබාදීම
- සෞඛ්‍ය හා පෝෂණය ලබාදීම - සානුබල සැපයීම - නව තාක්ෂණය හඳුන්වාදීම
- භෞතික ප්‍රාග්ධනය ඉහළ නැංවීම - යහපත් සේවක - සේව්‍ය සම්බන්ධතා වර්ධනය කිරීම

(කරුණු 4 කට ලකුණු 4)

02). i. ඉල්ලුමට බලපාන අනෙකුත් සාධක ස්ථාවරව තිබියදී සාමාන්‍ය භාණ්ඩයක මිල අඩුවන විට ඉල්ලුම් ප්‍රමාණය වෙනස්වීම කෙරෙහි ධන ආදායම් හා ආදේශන ප්‍රතිවිපාක හේතුවන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 4)

ii. පහත සඳහන් අවස්ථා වලදී නිෂ්පාදකයාගේ මුළු අයභාරයට කුමක් සිදුවේද?

(අ) අත්‍යාවශ්‍ය භාණ්ඩයක මිල වැඩිවීම (ආ)සුඛෝපභෝගී භාණ්ඩයක මිල වැඩිවීම

(ඉ) අත්‍යාවශ්‍ය භාණ්ඩයක මිල අඩුවීම (ඊ)සුඛෝපභෝගී භාණ්ඩයක මිල අඩුවීම (ලකුණු 4)

iii. ''සහල් සඳහා වෙළඳපොල සැපයුම වැඩි වුවද සහල් මිල වැඩි විය''. රූප සටහනක් ඇසුරින් මෙවැනි තත්ත්වයක් හට ගැනීමට හේතුව පැහැදිලි කරන්න. (ලකුණු 4)

iv. එක්තරා භාණ්ඩයක් සඳහා ඇති වෙළඳපොළ ඉල්ලුම් හා සැපයුම් ලේඛන පහත පරිදි වේ.

ඒකකයක මිල (රු.)	ඉල්ලුම් ප්‍රමාණය (ඒකක)	සැපයුම් ප්‍රමාණය (ඒකක)
40	160	40
60	120	60
80	80	80
100	40	100
120	0	120

(අ) වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම් වක්‍ර ප්‍රස්තාර සටහනකින් පෙන්නුම් කරන්න. (ලකුණු 2)

(ආ) වෙළෙඳපොළ සමතුලිතයේදී ඉල්ලුමේ හා සැපයුමේ මිල නම්‍යතාව ගණනය කරන්න. (ලකුණු 2)

(ඇ) සමතුලිතයේ දී හට ගන්නා නිෂ්පාදන අතිරික්තයේ ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 2)

(ඉ) ඒකකයක් රුපියල් 100 ක් ලෙස අවම මිලක් මෙම භාණ්ඩය සඳහා ආණ්ඩුව විසින් ප්‍රකාශයට පත්කර අතිරික්තය රජය මිලදී ගැනීමේ මිල ආධාරක ප්‍රතිපත්තිය මගින් අවම මිල සහතික කරනුලැබේ යැයි සලකන්න. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් නිෂ්පාදක අතිරික්තයේ හට ගන්නා වෙනස කොපමණද?(ලකුණු 2)

02). i. - අනෙකුත් සාධක ස්ථාවරව තිබියදී සලකා බලන සාමාන්‍ය භාණ්ඩයක මිල අඩු වූ විට පාරිභෝගිකයාගේ මූර්ත ආදායම ඉහළ යන බැවින් අදාළ භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය වැඩිකරයි. මෙය මිල අඩු වීමක ධන ආදායම් ප්‍රතිවිපාකය වේ. (ල. 2)

- අනෙකුත් සාධක නොවෙනස්ව තිබියදී භාණ්ඩයේ මිල අඩු වූ විට සාපේක්ෂව මිල වැඩි භාණ්ඩයට අදාළ ඉල්ලුම අඩු කර, සාපේක්ෂව මිල අඩු භාණ්ඩය ලාභ වීම තුළින් එම භාණ්ඩය සඳහා ඇති වන ඉල්ලුමේ වැඩිවීම මිල අඩු වීමක ධන ආදේශන ප්‍රතිවිපාකයවේ. (ල. 2)

ii. (අ) මුළු අයභාරය වැඩිවේ (ආ) මුළු අයභාරය අඩුවේ.
(ඉ) මුළු අයභාරය අඩුවේ (ඊ) මුළු අයභාරය වැඩිවේ. (ලකුණු 1 බැගින් ල. 4)

iii. සහල් සඳහා වෙළඳපොළ සැපයුම වැඩි වුවද සහල් මිල ඉහළ යාමට හේතු වන්නේ සහල් සැපයුම වැඩි වූ ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයකින් සහල් ඉල්ලුම වැඩිවීමය. (ල.2)
මෙවැනි තත්ත්වයක් පහත පරිදි රූපසටහනක් මගින් දැක්විය හැකිය.



P_1 - ඉල්ලුම් හා සැපයුම් වක්‍ර විතැන්විමට පෙර සහල් මිල
P_2 - ඉල්ලුම් හා සැපයුම් වක්‍ර විතැන් වීමෙන් පසු වෙළෙඳපල මිල

නිවැරදි ප්‍රස්ථාරයට (ල.2)

iv. (අ)



(නිවැරදි ප්‍රස්තාරයට ලකුණු 2)

(ආ) ඉල්ලුමේ මිල නම්‍යතාවය $= \frac{\Delta Qd}{\Delta P} \, x \, \frac{P}{Qd} = \frac{-40}{20} \, x \, \frac{80}{80} = -2$ (ල.1)

සැපයුමේ මිල නම්‍යතාවය $= \frac{\Delta Qs}{\Delta P} \, x \, \frac{P}{Qs} = \frac{20}{20} \, x \, \frac{80}{80} = 1$ (ල.1)

(ඇ) නිෂ්පාදක අතිරික්තය $= \frac{1}{2} \, x$ සමතුලිත ප්‍රමාණය x (ස.මිල - අවම සැ.මිල)
$= \frac{1}{2} \, x \, 80 \, x \, (80 - 0)$
$= \frac{1}{2} \, x \, 80 \, x \, 80$ = රු. 3200 (ල.2)

(ඉ) සහතික මිලෙන් පසු නිෂ්. අතිරික්තය $= \frac{1}{2} \, x$ නව සමතුලිත ප්‍රමාණය x (ස.මිල - අවම සැ.මිල)
$= \frac{1}{2} \, x \, 100 \, x \, (100 - 0)$
$= \frac{1}{2} \, x \, 100 \, x \, 100$ = රු. 5000

නිෂ්පාදක අතිරික්තයේ (වෙනස) හටගන්නා වැඩිවීම = පසු නිෂ්පාදක අතිරික්තය - පෙර නි.අ.
= රු. 5000 - රු. 3200
= රු. 1800 (ල.2)

03). i. කිසියම් නිෂ්පාදන ආයතනයක ගණකාධිකාරිවරයා විසින් ගිණුම් තබන පිරිවැයට වඩා ආර්ථික පිරිවැය විශාල වේ නම් ඉන් අදහස් කෙරෙන්නේ කුමක්ද? පැහැදිලි කරන්න. (ලකුණු 4)

ii. නිෂ්පාදක අතිරික්තය හා ආර්ථික බදු කුලිය යන සංකල්ප අතර වෙනස රූප සටහන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

iii. පූර්ණ තරගය හා ඒකාධිකාරී තරගය යන වෙළෙඳපොල තත්ත්ව අතර දැකිය හැකි අසමානතා සඳහන් කරන්න. (ලකුණු 4)

iv. පූර්ණතරගකාරී නිෂ්පාදන ආයතනයක් කිලෝ ග්‍රෑම් එකක් රු. 60 ක් වන මිලට රතු කැකුළු සහල් 180 Kg ක් සතියක් තුළ අලෙවි කරයි. මේ සඳහා ආයතනය දරන පිරිවැය පහත පරිදි වේ.
මුළු විචල්‍ය පිරිවැය රු. 9600 මුළු ස්ථාවර පිරිවැය රු. 1200 ආන්තික පිරිවැය රු. 60 (ලකුණු 4)
(අ) ආයතනය සතියකදී ලබන ආර්ථික ලාභය හා ඒකකයක නිෂ්පාදන පිරිවැය ගණනය කරන්න. (ලකුණු 4)
(ආ) මෙවැනි ලාභ තත්ත්වයක් යටතේ පවතින ආයතන වෙළෙඳපොළෙන් ඉවත්වේද? නව ආයතන වෙළෙඳපොළට ප්‍රවේශවේද? ඔබේ පිළිතුරට හේතුව පැහැදිලි කරන්න. (ලකුණු 4)

03). i. - ගිණුම්කරණ පිරිවැය තුළට ඇතුළත් වන්නේ නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා ආයතනය විසින් පිටතින් මිලදී ගත් යෙදවුම් සඳහා වැයකරන මුදල් ප්‍රමාණයේ වටිනාකම හෙවත් ඍජු පිරිවැය පමණි. (ආයතනය පිටතින් ලබාගත් නිෂ්පාදන සම්පත් වල ආවස්ථික පිරිවැය පමණි)

- ආර්ථික පිරිවැයට නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා ආයතනය විසින් භාවිතයට ගන්නා සියලුම නිෂ්පාදන සම්පත් වල මුළු ආර්ථික පිරිවැය හෙවත් ආවස්ථික පිරිවැය ඇතුළත් වේ.
- ආර්ථික පිරිවැයට ඍජු පිරිවැය හා වක්‍ර පිරිවැය යන සංරචක දෙකම ඇතුළත් වේ. වක්‍ර පිරිවැය යනු නිෂ්පාදන ක්‍රියාවලියට යොදා ගැනෙන ආයතනය සතු නිෂ්පාදන සම්පත් වල ආවස්ථික පිරිවැයයි.
- එබැවින් ආයතනය සතු නිෂ්පාදන සම්පත් නිෂ්පාදන ක්‍රියාවලියට යොදා ගන්නා තරමට වක්‍ර පිරිවැය විශාල වන අතර එවිට ආයතනයේ ගිණුම්කරණ පිරිවැයට වඩා ආර්ථික පිරිවැය විශාල වේ.

(කරුණකට ල. 1 බැගින් ලකුණු 4)

ii. භාණ්ඩයක වෙළඳපොළ මිලෙන් එම භාණ්ඩයේ අවම සැපයුම් මිල හෙවත් ආන්තික පිරිවැය අඩුකළ විට ලැබෙන අගය නිෂ්පාදක අතිරික්තයයි. (නිෂ්පාදක අතිරික්තය යනු කිසියම් නිමැවුම් ප්‍රමාණයකදී නිෂ්පාදකයා ලබන මුළු අයභාරයෙන් මුළු විචල්‍ය පිරිවැය අඩුකළ විට ලැබෙන අගයයි) (ල. 1)



(රූපසටහනට ල. 1)

ආර්ථික බදු කුලිය යනු කිසියම් නිෂ්පාදන සාධකයක් පවත්නා භාවිතයේ රඳවා ගැනීම සඳහා ඔහු අපේක්ෂා කරන අවම මුදල් ප්‍රමාණයට වඩා වැඩිපුර ලැබෙන මුදල් ප්‍රමාණයයි. (කිසියම් නිෂ්පාදන සාධකයක සංක්‍රාම ඉපැයුම් ඉක්මවා උපයා ගනු ලබන මුදල් ප්‍රමාණයයි) (ල.1)



(රූපසටහනට ල. 1)

iii.

පූර්ණ තරගකාරී වෙළෙඳපොළ	ඒකාධිකාරී තරග වෙළෙඳපොළ
- සමජාතීය භාණ්ඩ අලෙවි කරයි	- ප්‍රභේදික භාණ්ඩ අලෙවි කරයි
- මිල ගණුවෙකු වේ.	- මිල තීරකයෙකු වේ.
- ආයතනයේ ඉල්ලුම් වක්‍රය පූර්ණ නම්‍ය වේ	-ආයතනයේ ඉල්ලුම් වක්‍රය පහළට බෑවුම් වේ
- ප්‍රචාරණයක් දක්නට නොමැත	- ප්‍රචාරණ වියදමක් හට ගනී

(නිවැරදි සැසඳීමකට ලකුණු 2 බැගින් ලකුණු 4)

iv. (අ) මුළු අයභාරය = 180 x රු. 60
= රු.10800
මුළු පිරිවැය = TVC + TFC
= රු. 9600 + රු. 1200
= රු. 10800
ආයතනයේ ලාභය = අයභාරය - මුළු පිරිවැය
= රු. 10800 - 10800
= 0 ආර්ථික ලාභ ශුන්‍ය වේ. (ල.2)

ඒකකයක නිෂ්පාදන පිරිවැය = $\frac{\text{මුළු නිෂ්පාදන පිරිවැය}}{\text{නිමැවුම}}$
= $\frac{\text{රු. } 10800}{180}$ = රු. 60 (ල.2)

(ආ) - ආර්ථික ලාභ ශුන්‍ය තත්ත්වයක් යටතේ මේ ආයතනය කටයුතු කරයි. එවැනි තත්ත්වයක් නිෂ්පාදකයාට අවාසිදායක නොවේ.
- ආයතනය විසින් නිෂ්පාදනය සඳහා යොදා ගන්නා සියලුම නිෂ්පාදන සම්පත් වල ආවස්ථික පිරිවැය පියවා ගැනීමට ප්‍රමාණවත් ආදායමක් වන ප්‍රමාණික ලාභ මෙහිදී උපයා ගනී.
- ප්‍රමාණික ලාභ නිෂ්පාදකයා කර්මාන්තය අතහැර තම ආයෝජනය පිටතට ගෙනයාම වැළැක්වීමට ප්‍රමාණවත් වන ඉපයීමක් වන බැවින් නිෂ්පාදකයා තව දුරටත් නිෂ්පාදනයේ රැඳීසිටී.

- ප්‍රමාණික ලාභය ප්‍රාග්ධනයේ හා අවදානම් දැරීමේ ආවස්ථික පිරිවැය පියවීමට ප්‍රමාණවත් වුවද ආර්ථික ලාභ ශුන්‍ය බැවින් අලුත් ආයෝජකයන්ට කර්මාන්තයට ඇතුළු වීමට පෙළඹවීමක් හටනොගන්නා නිසා නව ආයතන වෙළඳපොළට ප්‍රවේශ නොවේ. (ල. 1 බැගින් ලකුණු 4)

04). i. ජාතික ගිණුම් දත්ත වල ප්‍රධාන භාවිත මොනවාද? (කරුණු 4 ට ලකුණු 2)

ii. රටක ආර්ථික වෘද්ධි අනුපාතය යනුවෙන් කුමක් අදහස්වේද? එය ගණනය කරන ආකාර මොනවාද? (ලකුණු 4)

iii. ජාතික ගිණුම් ඇස්තමේන්තු කිරීමේදී ගෙවුම් ශේෂයේ වර්තන ශේෂය ජාතික ගිණුම් හා සම්බන්ධ වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (වියදම් ගිණුම ඇසුරින්) (ලකුණු 4)

iv. දළ දේශීය නිමවුම ගණනය කිරීමේදී බැහැර කරන එළදායී නොවන ගනුදෙනු ලෙස ඔබ සලකන්නේ මොනවාද? (කරුණු 4 ට ලකුණු 2)

v. පහත දැක්වෙන්නේ ජාතික ගිණුම් පිළිබඳ දත්ත කිහිපයකි.

ශුද්ධ පොලී	60
බදු කුලී	80
විදේශ ශුද්ධ සාධක ආදායම	-20
සාමාගමික ලාභමත බදු	150
සේවා නියුක්ති ආදායම්	50
ගෙවන ලද ලාභ	30
විදේශ ශුද්ධ වර්තන සංක්‍රාම	300
නොගෙවූ ලාභ	40
ස්වයං සේවා නියුක්ති ආදායම්	120
ශුද්ධ වක්‍ර බදු	10
ප්‍රාග්ධන පරිභෝජන වියදම්	25

ඉහත දත්ත පදනම් කර ගනිමින් පහත සඳහන් ගිණුම් සංකල්ප ගණනය කරන්න.

(අ) දළ දේශීය ආදායම (ලකුණු 2)
(ආ) වෙළඳ මිලට දළ ජාතික නිෂ්පාදිතය (ලකුණු 2)
(ඇ) වැයකළ හැකි ශුද්ධ ජාතික ආදායම (ලකුණු 2)
(ඈ) දළ ලාභය (ලකුණු 2)

04). i.
- ආර්ථිකයේ කාර්ය සාධනය ඇගයීමට යොදා ගැනීම - ආර්ථික වෘද්ධිය මැනීම
- ඒක පුද්ගල ජාතික නිෂ්පාදිතය ඇස්තමේන්තු කිරීම - ආර්ථික ව්‍යුහමය ලක්ෂණ හඳුනාගැනීම
- අන්තර් ජාතික සැසදුම් සඳහා භාවිත කිරීම - ආර්ථික කාරක අතර සම්බන්ධතා හඳුනාගත හැකිවීම
- සම්පත් සංයුතිය හා උපයෝජනය හදුනා ගතහැකි වීම. (කරුණු 4 ට ලකුණු 2)

ii.
- කිසියම් කාල පරිච්ඡේද දෙකක් අතර මූර්ත දළ දේශීය නිෂ්පාදන හෝ මූර්ත දළ ජාතික නිෂ්පාදිතයෙහි හෝ වෙනස ප්‍රතිශතාත්මකව දැක්වීම ආර්ථික වෘද්ධි අනුපාතය යනුවෙන් හැදින්වේ. (ල.2)
- ආර්ථික වෘද්ධි අනුපාතය = $\frac{\text{වර්තමාන වර්ෂයේ මූර්ත ද.දේ.නි - පෙර වර්ෂයේ මූ.ද.දේ.නි.}}{\text{පෙර වර්ෂයේ මූර්ත දළ දේ. නිෂ්පාදිතය}} \times 100$ (ල.2)

iii.
- දළ දේශීය වියදම + භාණ්ඩ හා සේවා ගිණුමේ ශේෂය = දළ දේශීය නිෂ්පාදිතය
- දළ දේශීය වියදම + භාණ්ඩ හා සේවා ශේෂය + ආදායම් ගිණුමේ ශේෂය = දළ ජාතික නිෂ්පාදිතය
- දළ දේශීය වියදම + ජංගම ගිණුමේ ශේෂය = වැයකළ හැකි දළ ජාතික ආදායම
- දළ ජාතික නිෂ්පාදිතය + සංක්‍රාම ගිණුමේ ශේෂය = වැය කළ හැකි දළ ජාතික නිෂ්පාදිතය
- දළ ආයෝජනය + ශුද්ධ අපනයනය = දේශීය ඉතුරුම් (එක් කරුණකට 1 බැගින් ලකුණු 4)

iv. - එළදායී නොවන වෙළඳපොළ ගණුදෙනු - සංක්‍රාම - මුදල්මය පත්‍රිකා ආශ්‍රිත ගණුදෙනු
- පාවිච්චි කළ භාණ්ඩ විකිණීම ආශ්‍රිත ගණුදෙනු (කරුණු 4 සඳහා ල. 2)

v. (අ)

සේවා නියුක්ති ආදායම්	50	
ස්වයං සේවා නියුක්ති ආදායම්	120	
ශුද්ධ පොලී	60	
බදු කුලී	80	
සමාගමික ලාභමත බදු	150	
ගෙවන ලද ලාභ	30	
නොගෙවූ ලාභ	40	
ප්‍රාග්ධන පරිභෝජන වියදම්	25	
දළ දේශීය ආදායම	555	(ලකුණු 2)

(ආ)

දළ දේශීය ආදායම	555	
ශුද්ධ වක්‍ර බදු	10	
විදේශ ශුද්ධ සාධක ආදායම	-20	
වෙළඳ මිලට දළ ජාතික නිෂ්පාදිතය	545	(ලකුණු 2)

(ඇ) දළ දේශීය ආදායම	555	
ප්‍රාග්ධන පරිභෝජන වියදම	(25)	
විදේශ ශුද්ධ සාධක ආදායම	-20	
විදේශ ශුද්ධ වර්තන සංක්‍රාම	300	
වැයකළ හැකි ජාතික ආදායම	810	(ලකුණු 2)
(ඈ) ගෙවූ ලාභ	30	
නොගෙවූ ලාභ	40	
ලාභ මත බදු	150	
ප්‍රාග්ධන පරිභෝජන වියදම්	25	
දළ ලාභය	245	(ලකුණු 2)

05). **i.** **සමාහාර ඉල්ලුම් හා සමාහාර සැපයුම් වක්‍ර භාවිතයෙන් සමතුලිතය තීරණය වන ආකාරය පැහැදිලි කරන්න.** **(ලකුණු 4)**

ii. **විවෘත ආර්ථිකයක ආදායමේ වෘත්ත ප්‍රවාහය තුළ ඇතුලත් විදීම් හා කාන්දුවීම් යන්නෙන් කුමක් අදහස් වේදැයි පැහැදිලි කරන්න.** **(ලකුණු 4)**

iii. **රටක සාර්ව ආර්ථික සමතුලිතය වෙනස්වීමට බලපාන සාධක මොනවාද?** **(ලකුණු 4)**

iv. **කල්පිත ආර්ථිකයකට අදාළ සාර්ව ආර්ථික දත්ත කීපයක් පහත දැක්වේ.**

පරිභෝජනය **C = 150 + 0.75 Yd**

ආයෝජනය **I = 200**

ආණ්ඩුවේ මිලදී ගැනීම් **G = 100**

බදු අයකිරීම් **T = 60**

(අ) මෙම ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායම් මට්ටම නිර්ණය කරන්න **(ලකුණු 2)**

(ආ) ආයොජන වියදම් රු.බි. 400 දක්වා ඉහළ ගියහොත් නව සමතුලිත ආදායම් මට්ටම කොපමණද? (ල. 2)

(ඇ) රජයේ වියදම් ගුණකයේ අගය සොයන්න. **(ලකුණු 2)**

(ඉ) මෙම ආර්ථිකයේ ස්වායත්ත වියදම් වර්ග මොනවාද? **(ලකුණු 2)**

05). i. -ආර්ථිකයක සමාහාර ඉල්ලුම සමාහාර සැපයුමට සමාන වන අවස්ථාවේදී සාර්ව ආර්ථික සමතුලිතය තීරණය වේ.



AD සමාහාර ඉල්ලුම, AS සමාහාර සැපයුම සමාන වන විට සාර්ව ආර්ථික සමතුලිතය තීරණය වේ.
(ප්‍රස්ථාරයට ල. 2 යි. පැහැදිලි කිරීමට ල. 2)

ii. - ආදායම් වියදම් වෘත්ත ප්‍රවාහය තුළ විදීම් ලෙස සලකනු ලබන්නේ සමස්ත ඉල්ලුම (වියදම) ශක්තිමත් කෙරෙන වියදම් වර්ග වේ. (ල. 1)

- විවෘත ආර්ථිකයක් තුළ විදීම්වලට ඇතුලත් වන්නේ ආයෝජන වියදම් (I) භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සඳහා රජය දරන වියදම් (G) සහ අපනයන (X) යන ඒවාය. (ල. 1)
- ආදායම් වියදම් වෘත්ත ප්‍රවාහය තුළ කාන්දු වීම් ලෙස සලකනුයේ දේශීය භාණ්ඩ හා සේවා මත කෙරෙන සමස්ත ඉල්ලුම (වියදම) දුර්වල කරන හෙවත් ඉල්ලුම් ප්‍රවාහයෙන් ඉවතට යන ප්‍රවාහයන්ය. (ල. 1)
- විවෘත ආර්ථිකයක කාන්දුවීම් ගණනයට ඇතුලත් වන්නේ ඉතුරුම් (S) ශුද්ධ බදු (T) ආනයන (M) යන ඒවාය. (සංකේත වලින් දැක්වීම ප්‍රමාණවත් නොවේ.) (ල.1)

iii. - පරිභෝජන ශ්‍රිතය වෙනස්වීම - ස්වාධීන ආයෝජන වෙනස්වීම - රාජ්‍ය මිලදී ගැනීම වෙනස්වීම
- ස්වාධීන බදුවල වෙනස්වීම - සංක්‍රාම වියදම් වෙනස්වීම (කරුණු 4 කට ලකුණු 4)

iv. සමතුලිත ජාතික ආදායම් මට්ටම

(අ) $Y = E$

$E = C+I+G$

$Y = C+I+G$

$Y = 150 + 0.75\ Yd + 200 + 100$

$Y = 150 + 0.75\ (Y - T) + 300$

$Y = 450 + 0.75\ (Y - 60)$

$Y = 450 + 0.75\ Y - 45$

$Y = 405 + 0.75Y$

$Y - 0.75Y = 405$

$0.25Y = 405$

$Y = \frac{405}{0.25}$ $\underline{\underline{Y = 1620}}$ (ලකුණු 2)

(ආ) $\Delta I = 200$

$\Delta Y = K\Delta I$

$K = \frac{1}{1-b} = \frac{1}{1-0.75} = \frac{1}{0.25} = 4$

$\Delta Y = 4 \, x \, 200$

$\Delta Y = 800$

$Y = 1620 + 800$, $\underline{\underline{Y = 2420}}$ (ලකුණු 2)

ඉහත ''අ'' හි ගණනය කිරීමට අදාළව ආයෝජන 200 වෙනුවට 400 යොදා Y හි අගය ගණනය කළ ද නිවැරදි වේ.

(ඇ) රජයේ වියදම් ගුණකය

$K_G = \frac{1}{1-b} = \frac{1}{1-0.75}$

$K_G = \frac{1}{0.25}$, $= \underline{\underline{4}}$ (ලකුණු 2)

(ඉ) පරිභෝජන වියදම - ආයොජන වියදම් - රජයේ පරිභෝජන වියදම් (ලකුණු 2)

<u>ආ උප කොටස</u>

06). i. ඉල්ලුම් තැම්පතු සහ ආදේශ මුදල් අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)

ii. ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතිකය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 3)

iii. ප්‍රතිපත්ති පොලී අනුපාතිකවල වෙනස්වීම් මිල මට්ටම හා නිමැවුම කෙරෙහි බලපාන ක්‍රියාවලිය විස්තර කරන්න. (ලකුණු 4)

iv. කොටස් වෙළඳපලේ තැරැව්කාර ආයතනයක් විසින් මහ බැංකුවට පිළිණපත් විකිණීම මගින් ලබාගත් රු.මි. 20000 ක මුදලක් වාණිජ බැංකුවක තැන්පත් කළ බව සිතන්න.

(අ) මෙම ගනුදෙනුව හේතුවෙන් මුදල් සැපයුමට කෙබඳු බලපෑමක් ඇති කරයිද? (ලකුණු 3)

(ආ) සංචිත අනුපාතය 25% ක් නම් මෙම ක්‍රියාව හේතුවෙන් සමස්ත බැංකු පද්ධතියට අතිරේක ණය කොපමණ ලබාදිය හැකිද? (ලකුණු 3)

(ඇ) එබඳු ණය ප්‍රසාරණයක් සිදු නොවීම සඳහා අදාළ වන මූලික කොන්දේසි මොනවාද? (ලකුණු 3)

06). i.
- ඉල්ලුම් තැම්පතු යනුවෙන් අදහස් වන්නේ මහජනයා නමින් වාණිජ බැංකුවල ජංගම ගිණුම්වල කරනු ලබන තැන්පතුය.
- මෙම තැන්පතු හිමියන්ට චෙක්පත් මගින් ගණුදෙනු කළ හැකිවන අතර හා මුදල් සැපයුමට මේවා එකතු කරයි.
- ද්‍රවශීලතායෙන් ඉහළ වත්කමක් වේ.
- ආදේශක මුදල් යනු මුදල් වෙනුවට භාවිත කළ හැකි ණයපත් වැනි උපකරණ වේ. මෙම මුදල් මුදල් සැපයුමට ඇතුළත් නොවේ. මේවා තාවකාලික හුවමාරු මාධ්‍ය වේ. (ලකුණු 4)

ii. ප්‍රතිපත්ති පොලී අනුපාතිකය යනුවෙන් අදහස් වන්නේ මූල්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීමේදී මහ බැංකුව විසින් භාවිත කරනු ලබන පොලී අනුපාතිකයන්ය.

උදා - ප්‍රතිමිලදී ගැනුම් පොලී අනුපාතිකය, ප්‍රති විකුනුම් පොලී අනුපාතිකය, බැංකු පොලී අනුපාතිකය (ලකුණු 3)

iii.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ පොලී අනුපාත වෙනස්කළ විට සමස්ත ආර්ථිකයේ පොලී අනුපාත ව්‍යුහ වෙනස් වීමට භාජනය වේ.
- ප්‍රතිපත්ති පොලී අනුපාත ඉහළ නැංවූ විට මුදල් වෙළඳපොලේ අනුපාතිකද ඉහළ යන අතර පොලි අනුපාත අඩුකළ විට මුදල් වෙළඳ පොලේ පොලී අනුපාතිකයද පහළ වැටේ.
- සමස්ථ ඉල්ලුමේ වෙනස්වීම් සඳහා ද පොලී අනුපාත වෙනස්වීම් බලපායි.
  උදා - කල්පවත්නා පාරිභෝජන භාන්ඩ මිලදී ගැනීම් - උකස් පදනමින් මිලට ගැනීම් - පෞද්ගලික ආයෝජන
- පොලී අනුපාත වෙනස්වන විට වත්කම් මිලද එය ප්‍රතිලෝම ආකාරයට වෙනස්වේ. (ලකුණු 4)

iv. (අ)
- මෙම මුදල් තැන්පතුව හේතුවෙන් මුදල් සැපයුමේ ප්‍රසාරණයක් රුපියල් 20000 කින් සිදුවේ.
- එයට හේතුව පිළිණපත් මිලදීගැනීම සඳහා මහ බැංකුව නව මුදල් නිකුතුවක් කිරීමයි. (ලකුණු 3)

(ආ)
- සංචිත අනුපාතය 25%
- තැන්පතු ප්‍රමාණය 20000
- තබාගත යුතු සංචිත ප්‍රමාණය $20000 \, x \frac{25}{100} = 5000$

අධි සංචිත 20000 - 5000

15000

පද්ධතියට මැවිය හැකි තැන්පතු

$= 15000 \times \frac{1}{R}$

$= 15000 \times \frac{1}{\frac{25}{100}}$

$= 15000 \times 1 \times \frac{100}{25} = 15000 \times 4 = \underline{60000}$ (ලකුණු 3)

(ඇ) - වාණිජ බැංකු විසින් අධිසංචිත පවත්වාගෙන යාම
- ණය සඳහා ඉල්ලුම අඩුවීම - බැංකු පද්ධතියෙන් පිටතට මුදල් කාන්දුවීම (ලකුණු 3)

07). i. පොදු භාණ්ඩ වෙළඳපොලෙන් නොසැපයිමට හේතු දෙකක් සඳහන් කරන්න (ලකුණු 2)
ii. ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය තත්ත්වය තුළ දක්නට ලැබෙන දුර්වලතා මොනවාද? (ලකුණු 4)
iii. සාමාන්‍ය බදු අනුපාතිකය හා ආන්තික බදු අනුපාතිකය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)
iv. රාජ්‍ය අයවැයෙහි අතුරු සම්මත ගිණුමක් යනුවෙන් අදහස් වන්නේ කුමක්ද? අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කරන්නේ කුමන අවස්ථාවලදීද? (ලකුණු 4)
v. රාජ්‍ය ණයෙහි ආර්ථික ප්‍රතිවිපාක ගෙන හැර දක්වන්න. (ලකුණු 4)
vi. ශ්‍රී ලංකාවේ රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වය පිළිබඳ ව්‍යාපෘති සඳහා නිදසුන් දෙකක් ඉදිරිපත් කරන්න(ල. 2)

07). i. - එය සාමූහික පරිභෝජනයක් නිසා
- මිල නොගෙවන්නන් පරිභෝජනයෙන් ඉවත් කළ නොහැකි නිසා
- ලාභ ඉපයීමට එමගින් නොහැකි නිසා (කරුණු 2 ලකුණු 2)

ii. - රාජ්‍ය ආදායම අඩු අගයක් ගැනීම
2010 = 12.7% 2015 = 13.3 % 2016 = 14.2% (කරුණු 2 ලකුණු 2)
- රාජ්‍ය වියදම්වල දක්නට ලැබෙන අනම්‍යශීලිභාවය
- පොලී ගෙවීම්, වැටුප් ගෙවීම් හා සංක්‍රාම ගෙවීම් වල මුළු රාජ්‍ය විදයමින් විශාල ප්‍රමාණයක් වැය කිරීම. (60%)
- අධ්‍යාපනය සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණය වැනි මානව සංවර්ධන ක්ෂේත්‍රය තුළ රජයේ වියදම් ප්‍රමාණවත් නොවීම
- රාජ්‍ය ව්‍යවසායන් විශාල වශයෙන් අලාභ ලබමින් රාජ්‍ය අංශයෙහි අකාර්යක්ෂමතාවක් දක්නට ලැබීම. (කරුණු 4 ලකුණු 4)

iii. - සාමාන්‍ය බදු අනුපාතිකය යනු (Average tax Rate) ගෙවන ලද බදු මුදල බදු පදනමේ වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස දැක්වීමයි. එය ගණනය කරනු ලබන්නේ,

සාමාන්‍ය බදු අනුපාතිකය = $\frac{\text{ගෙවන ලද මුළු බදු මුදල}}{\text{බදු පදනමේ වටිනාකම}} \times 100$ (ල. 2)

- ආන්තික බදු අනුපාතිකය යනු (Marginal tax Rate) ගෙවූ මුළු බදු මුදල්වල වෙනසක් (ΔT) බදු පදනමේ වටිනාකමේ වෙනසක් (ΔTB) අතර අනුපාතයයි. එය ගණනය කරනු ලබන්නේ,

ආන්තික බදු අනුපාතිකය = $\frac{\text{ගෙවූ බදු මුදලේ වෙනස}}{\text{බදු පදනමේ වටිනාකම}} \times 100$ (ල. 2)

iv. - අතුරු සම්මත ගිණුමක් යනුවෙන් අදහස් වන්නේ ඉදිරි වර්ෂයට අදාල විසර්ජන කෙටුම්පත ඉදිරිපත් කිරීමට නොහැකි වූ විට වැය යෝජනා පමණක් ඇතුළත් කොට ඉදිරිපත් කරන්නකි. අයවැයක් ඉදිරිපත් කිරීමට නොහැකි වන විට වියදම් කිරිමට අනුමැතිය ලබාගැනීමට ඉදිරිපත් කරන්නකි. (ල.2)
- අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කරන අවස්ථා
- රටේ යුධමය තත්ත්වයක් ඇති වූ විටකදී
- රටේ මැතිවරණ තත්වයක් වැනි අනපේක්ෂිත තත්තවයක් රටතුළ ඇතිවන විටදීය (ලකුණු 2)

v. - රාජ්‍ය ණය සේවා වියදම් ඉහළ යාම - තෙරපුම් ප්‍රතිවිපාකය
- ණය පොලී ඉහළ යාම නිසා අයවැය හිඟය පුළුල් වීම
- විදේශ ණය සේවා කරණය නිසා ගෙවුම් ශේෂය මත දැඩි පීඩනයක් ඇතිවීම හා විනිමය අනුපාතය අවප්‍රමාණය වීම
- ණය ගෙවීමට තව තවත් ණය ගැනීමෙන් ණය උගුලකට හසුවීම
- රාජ්‍ය වියදම් ප්‍රමුඛතා වෙනස්වීමට තුඩු දේ
- ණය ශ්‍රේණිය පහත වැටී විදේශ ආයෝජන දුර්වලවීම (ඕනෑම කරුණු 4 කට ලකුණු 4)

vi. - දකුණු ආසියානු පිවිසුම් පර්යන්ත ව්‍යාපෘතිය
- කොළඹ දකුණු බහාලුම් පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතිය
- කොළඹ නැගෙනහිර බහාලුම් පර්යන්ත ව්‍යාපෘතිය (කරුණු 2 කට ලකුණු 2)

08). **i.** **අන්තර් ජාතික වෙළඳාමට පදනම් වූ සාපේක්ෂ වාසි න්‍යාය හා නිරපේක්ෂ වාසි න්‍යාය අතර වෙනස උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 4)**

ii. **නව ගෙවුම් තුළන ඉදිරිපත් කිරීමට අනුව සමස්ථ ශේෂය අර්ථ දක්වා එය ගණනය කරන ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 4)**

iii. **ද්විත්ව සටහන් මූලධර්මයට අනුව පහත දැක්වෙන ගණුදෙනු ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂ ලේඛනයේ හර සහ බැර වශයෙන් වාර්තා කරන ආකාරය දක්වන්න.**

(අ) ඇමරිකානු ඩොලර් 400 ක ඇඟලුම් ඇමරිකාවට අපනයනය කිරීම

(ආ) දේශීය සමාගමක් විදේශ රටක ඇඟලුම් කර්මාන්ත ශාලාවක් ඩොලර් 1000 ක් යොදා ආරම්භ කිරීම

(ඇ) ඩොලර් මිලියන 15 ක ආයෝජන ආදායමක් ලැබීම

(ඉ) ජපන් ආයෝජකයෙකු ඩොලර් මිලියන 10 ක් වටිනා කොටස් කොළඹ කොටස් හුවමාරුවෙන් මිලට ගැනීම (ලකුණු 4)

iv. **නිදහස් වෙළඳාම සීමා කරන තීරුබදු නොවන වෙළඳ බාධක 4 ක් සඳහන් කරන්න (ලකුණු 4)**

v. **සංචිත වත්කම් යන්නෙන් කුමක් අදහස් වේද? ඊට ඇතුළත්කරන වත්කම් මොනවාද? (ලකුණු 4)**

08). i. - නිරපේක්ෂ වාසි න්‍යාය යනු කිසියම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීම සඳහා සමාන යෙදවුම් ප්‍රමාණයක් භාවිතා කිරීමේදී එක් රටකට වඩා තවත් රටකට වැඩි නිමැවුම් ප්‍රමාණයක් හෝ කිසියම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමට එක් රටකට වඩා තවත් රටකට වඩා අඩු පිවරියක් ඇතිවීමේ තත්ත්වයකි. (ල. 1)

උදා - ශ්‍රමිකයෙකුගේ දින නිමැවුම

භාණ්ඩය	ඉන්දියාව	ශ්‍රී ලංකාව
X	8	4
Y	4	3

ඉහත නිදසුනට අනුව X භාණ්ඩය නිපදවීමේ නිරපේක්ෂ වාසිය ඉන්දියාවට හිමිවන අතර Y භාණ්ඩය නිපදවීමේ නිරපේක්ෂ වාසියද ඉන්දියාවටම හිමිවේ. (ලකුණු 1)

- සාපේක්ෂ වාසි න්‍යාය යනු තමන්ට සාපේක්ෂ වශයෙන් අඩු ආවස්ථික පිරිවැයක් යටතේ නිපදවිය හැකි භාණ්ඩ පිළිබඳ විශේෂීකරණය කොට ඒවා අපනයනය කළ යුතු බව හා සාපේක්ෂ වශයෙන් වැඩි ආවස්ථික පිරිවැයක් සහිත භෘණ්ඩ ආනයනය කළ යුතු බවයි. (ල. 1)

උදා - ශ්‍රමිකයෙකුගේ දින නිමැවුම

භාණ්ඩය	ඉන්දියාව	ශ්‍රී ලංකාව
X	8	4
Y	4	3

ඉහත නිදසුනට අනුව ඉන්දියාවේ X භාණ්ඩයේ ආවස්ථික පිරිවැය Y භාන්ඩ $\frac{4}{8} = \frac{1}{2}$ කි. ශ්‍රී ලංකාවේ $\frac{3}{4}$ කි. Y භාණ්ඩය සම්බන්ධයෙන් ඉන්දියාවේ X භාණ්ඩය ආවස්ථික පිරිවැය $\frac{4}{8} = 2$ කි. ලංකාවේ $\frac{4}{8} = 1\frac{1}{3}$ කි. මේ අනුව X භාණ්ඩයේ අඩුම අවස්ථික පිරිවැය ඇත්තේ ඉන්දියාවටයි. ඉන්දියාවට සාපේක්ෂ වාසි හිමි වේ. Y භාණ්ඩය සම්බන්ධයෙන් අඩුම ආවස්ථික පිරිවැය ශ්‍රී ලංකාවට හිමි වන නිසා Y භාණ්ඩයේ සාපේක්ෂ වාසි ශ්‍රී ලංකාවට හිමිවේ. (ල. 1)

ii. - ගෙවුම් තුළන ලේඛනයේ නව ඉදිරිපත් කිරීමට අනුව ගෙවුම් ශේෂයේ සමස්ත ශේෂය යනු ශුද්ධ විදේශ සංචිතවල වෙනස්වීමයි. මෙහිදී කාලච්ඡේදය ආරම්භයේ හා කාලපරිච්ඡේදය අවසානයේ ශුද්ධ සංචිත වත්කම් සැලකිල්ලට ගැනේ. එනම් සලකා බලන වර්ෂයේ ශුද්ධ සංචිත වත්කම්වලින් පෙර වර්ෂයේ ශුද්ධ සංචිත වත්කම් අඩු කිරීමයි. (ල. 2)

- ගණනය කරන ආකාරය

කාලච්ඡේදය අවසානයේ සලකා බලන වර්ෂයේ ශුද්ධ වත්කම් තත්ත්වය	=	XX
කාලච්ඡේදය මුල පෙර වර්ෂයේ ශුද්ධ වත්කම් තත්ත්වය	= -	XX
ශුද්ධ විදේශ සංචිතවල වෙනස හෙවත් සමස්ත ශේෂය	=	XX (ල. 2)

iii.

(අ) මූල්‍ය ගිණුම හර 400	වෙළඳ භාණ්ඩ ගිණුම බැර 400
(ආ) මූල්‍ය ගිණුම (ඍජු ආයෝජන) හර 1000	මූල්‍ය ගිණුම බැර 1000
(ඇ) මූල්‍ය ගිණුම හර 15	ප්‍රාථමික ආදායම් ගිණුම බැර 15
(ඉ) මූල්‍ය ගිණුම මුදල් තැන්පතු ගිණුම හර 10	මූල්‍ය ගිණුම විවිධ ආයෝජන (කළඹ ආයෝජන) බැර 10
	(ල. 1 බැගින් ල . 4 යි)

iv. තීරු බදු නොවන වෙළඳ බාධක

- ආනයන පංගු ක්‍රමය හෙවත් සලාක නියම කිරීම (Quota)
- ස්වේච්ඡාවෙන් අපනයන සීමා කිරීම
- ප්‍රපාතනය (Dumping)
- නිෂ්පාදන සහනාධාර දීම
- ආණ්ඩුවේ ප්‍රතිපත්තීන්
- වෙළඳ සම්බාධක පැනවීම (Embargos)

- විනිමය පාලනය (Exchange Control)
- නිෂ්පාදන ප්‍රමිතීන් නියම කිරීම (කරුණු 1 ට ල. 1 බැගින් ලකුණු 4)

v. - සංචිත වත්කම් යනු මහ බැංකුව මගින් පාලනය කරන විදේශීය සංචිත වත්කම් හා සංචිත ආශ්‍රිත වගකීම්වල ශුද්ධ වෙනස්වීමය. (ල. 2)
ඊට ඇතුලත් වන දෑ
- විදේශ විනිමය ශේෂ - මූල්‍ය අරමුදලේ සංචිත පහසුකම්
- විගැහි (SDR) - විශේෂ ගැනුම් හිමිකම් - මූල්‍ය රන් - සුරැකුම්පත් (කරුණු 2 කට ලකුණු 2)

09). i. ආර්ථික වෘද්ධිය යනුවෙන් කුමක් අදහස්වේද? එය මනිනු ලබන්නේ කෙසේද? (ලකුණු 4)
ii. රටක ඵලදායිතා මට්ටම තීරණය කරන ප්‍රධාන සාධක මොනවාද? (ලකුණු 4)
iii. වර්තමාන ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යවසායකගේ අකාර්යක්ෂමතා රාශියක් දක්නට ලැබේ. ඒ සඳහා බලපෑ සාධක මොනවාද? (ලකුණු 4)
iv. වර්තමාන ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහයේ වෙනස්කම් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශත සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 4)
v. ඌණ සේවා නියුක්තිය යනුවෙන් කුමක් අදහස්වේද, එහි ලක්ෂණ මොනවාද? (ලකුණු 4)

09). i. - ආර්ථික වෘද්ධිය යනු කිසියම් රටක දිගුකාල පරිච්ඡේදයක් තුළ (එනම් වසර 10) එරට මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ / මූර්ත දළ ජාතික නිෂ්පාදිතයේ සිදුවන අඛණ්ඩ වර්ධනයයි. එමගින් ආර්ථිකයේ නිෂ්පාදන විභවතාවයේ දිගුකාලීන ප්‍රසාරණයක් සිදුවේ. (ල. 2)
- ආර්ථික වෘද්ධිය මැනීම සඳහා ක්‍රම දෙකක් දක්නට ලැබේ.
- මූර්ත දළ දේශීය නිෂ්පාදිතය හෝ මූර්ත දළ ජාතික නිෂ්පාදිතයේ වාර්ෂික ප්‍රතිශතය වෙස්වීම
- ප්‍රතිශීර්ෂ මූර්ත ද.දේ.නි. සහ ප්‍රතිශීර්ෂ මූර්ත ද.දේ.නි. හෝ ජාතික නිෂ්පාදිතයේ වාර්ෂික ප්‍රතිශතක වෙනස(ල.2)

ii. - ශ්‍රමයේ ගුණාත්මක තත්ත්වය - තාක්ෂණය හා ශිල්ප ක්‍රම - යටිතල පහසුකම් - ආකල්ප - නවෝතා
- මූල්‍ය වෙළඳ පොළ කාර්යක්ෂමතාවය - රටේ පවතින ස්වභාවික සම්පත් - කළමනාකරණ තත්ත්වය
(කරුණකට 1 බැගින් ලකුණු 4)

iii. - මිලදී ගැනීමේ ක්‍රියාවලියේ අනුමත ක්‍රමවේදයන්ට පටහැනිව ක්‍රියා කිරීම
- මුදල් අවභාවිතය, නාස්තිය, දූෂනය, අල්ලස්
- සේව්‍ය සේවක සම්බන්ධතා දුර්වලවීම
- විගණන විමසුම් වලට පිළිතුරු නොසැපයීම
- කළමනාකරණ නොහැකියාව
- දේශපාලනීකරණය
- රාජ්‍ය ව්‍යාපාර කමිටු නිර්දේශ කෙරෙහි සැලකිල්ලක් නොදැක්වීම (කරුණකට 1 බැගින් ලකුණු 4)

iv.

ආර්ථික ව්‍යුහය	ද.දේ.නි. දායකත්වය
- කෘෂිකාර්මික අංශය	7.1 %
කාර්මික අංශය	26.8%
සේවා අංශය	56.5% (ල. 2)

- වර්තමාන ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහයේ කෘෂිකාර්මික අගයෙන් ද.දේ. නිෂ්පාදිතයට දක්වන සාපේක්ෂ දායකත්වය ඉතා පහළ මට්ටමක පවතී.
- කාර්මික අංශයෙන් දළ දේශීය නිෂ්පාදිතයට දක්වන සාපේක්ෂ දායකත්වය කෘෂි අංශයට වඩා ඉහළ අගයක් ගෙන තිබේ.
- වර්තමාන ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහය තුළ සේවා අංශයේ සාපේක්ෂ දායකත්වය කෘසි අංශය හා කාර්මික යන අංශ දෙකටම වඩා ඉහළ අගයක් ගෙන තිබේ. (ලකුණු 2)

v. - ඌණ සේවා නියුක්තිය යනුවෙන් අදහස් වන්නේ සේවා නියුක්තියන්ගේ ශ්‍රමය ඌණ උපයෝජනය වී තිබීමයි. ශ්‍රමයේ ඵලදායිතාවය පහළ මට්ටමක පැවතීමයි (ල. 2)
ඌණ සේවා නියුක්තියක පහත ලක්ෂණ දැකිය හැකිය.
- පූර්ණ කාලීන වැඩ කලද අඩු ආන්තික ඵලදාවක් පැවතීම
- පූර්ණ කාලීනව වැඩ නොමැති වීම
- සුදුසුකම්වලට අනුව රැකියා නොලැබීම
- සතියකට පැය 35 හෝ 40 ට අඩුවෙන් වැඩ කිරීම
- ශ්‍රමයේ ඵලදායිතාවය අඩු මට්ටමක පැවතීම (කරුණු 1 සඳහා ලකුණු 1 බැගින් ලකුණු 2)

10). i. මානව සංවර්ධන දර්ශයේ සංරචක නම් කරන්න. (ලකුණු 3)
ii. මානව සංවර්ධනය මත රටවල් වර්ගීකරණය කර දක්වන්න. (ලකුණු 4)
iii. ශ්‍රී ලංකාවේ තරගකාරිත්වය වැඩි දියුණු කිරීම සඳහා ගතයුතු පියවර 4 ක් නම් කරන්න (ලකුණු 4)
iv. 2015 න් පසු අත්කර ගැනීමට අපේක්ෂිත තිරසාර සංවර්ධන අරමුණු හතරක් නම් කරන්න. (ලකුණු 4)
v. තිරසාර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම උදෙසා වර්තමාන ශ්‍රී ලංකා රජය ගෙන ඇති පියවර මොනවාද? (ලකුණු 5)

10). i. - දීර්ඝායුෂ → උපතේදී ජීවන අපේක්ෂාව

- දැනුම → පාසල් අධ්‍යාපනය ලැබූ වසර සංඛ්‍යාවේ මධ්‍ය අගය
  දැනුම → දරුවෙකු අධ්‍යාපනයේ නිරත වෙතැයි අපේක්ෂිත වසර ගණන (ලකුණු 3)
- යහපත් ජීවන තත්ත්වය → ක්‍රය ශක්ති සාම්‍ය ඒක පුද්ගල දළ ජාතික ආදායම (US $)

ii. - පහළ මානව සංවර්ධනය සහිත රටවල් 0 - 0.550 ට අඩු
- මධ්‍යම මානව සංවර්ධනය සහිත රටවල් 0.551 - 0.699
- ඉහළ මානව සංවර්ධනය සහිත රටවල් 0.700 - 0.799
- ඉතා ඉහළ මානව සංවර්ධනය සහිත රටවල් 0.800 හෝ වැඩි (ලකුණු 4)

iii. - ස්ථාවර ජාතික සංවර්ධන ප්‍රතිපත්තියක අවශ්‍යතාවය
- යටිතල පහසුකම් වල ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම
- නිලධාරිවාදය සීමාකිරීම
- පර්යේෂණ හා සංවර්ධන සහ නවෝත්පාදනය
- සාර්ව ආර්ථික ස්ථායිතාවය දියුණු කිරීම (ලකුණු 4)

iv. - සියළු ස්වරූපයේ දරිද්‍රතාව නිමාකිරීම
- කුසගින්න නිමාකිරීම, ආහාර සුරක්ෂිතතාව අත්කර ගැනීම
- සෞඛ්‍ය සම්පන්න දිවි පැවැත්ම තහවුරු කිරීම සහ සෑම වයස් කාණ්ඩ වලම සුබී භාවය තහවුරු කිරිම
- සියළු දෙනාට අදාලවන සාධාරණ හා ගුණාත්මක අධ්‍යාපනයක් සහිත යාවජීව ඉගෙනුම තහවුරු කිරීම
- ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව අත්කර ගැනීම කාන්තාවන් බලාත්මක කිරීම
- සියළු දෙනාට ජලය හා සනීපාරක්ෂව පැවැතීම හා එහි චිරස්තායී කළමනාකරණය තහවුර ැකිරීම
- රටවල් තුළ සහ රටවල් අතර අසමානතා අඩු කිරීම
- නගර සහ මානව ජනාවාස සුරක්ෂිත කිරීම
- භූගෝලීය ජෛව පද්ධතියේ චිරස්තායී භාවිතය තහවුරු කිරීම
- චිරස්තායි සම සාර්ව සහභාගිත්ව වෘද්ධි ප්‍රවර්ධනය සහ සියලු දෙනාටම පූර්ණ සහ ඵලදායි සේවා නියුක්ති ප්‍රවර්ධනය (එක් කරුණකට 1 බැගින් ල. 4)

v. - ග්‍රාම ශක්ති , $V\ 20-25$
- ජාතික ආහාර නිෂ්පාදන වැඩ සටහන
- ප්‍රථම වකුගඩු රෝහලක් ඉදිකිරීම
- ලඟම පාසල හොඳම පාසල වැඩසටහන
- කාන්තා නියෝජනය 25% තහවුරු කිරීම
- මොරගහ කන්ද ජලාශය ඉදිකිරීම
- නීල හරිත අයවැය හා සංවර්ධන යුගය
- මෙගා පොලිස්, වරාය නගරය ඉදිකිරීම
- වනරෝපා වැඩ සටහන
- පැරිස් ගිවිසුම (එක් කරුණකට 1 බැගින් ලකුණු 5)